# ව්‍යවසායකත්ව අධ්‍යයනය
# ගුරු මාර්ගෝපදේශය
## 10 ශ්‍රේණිය

(2015 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරනු ලැබේ)

වාණිජ දෙපාර්තමේන්තුව

ජාතික අධ්‍යාපන ආයතනය

ශ්‍රී ලංකාව

Web:www.nie.lk
Email: info@nie.

# ව්‍යවසායකත්ව අධ්‍යයනය
# ගුරු මාර්ගෝපදේශය
## 10 ශ්‍රේණිය

වාණිජ දෙපාර්තමේන්තුව

ජාතික අධ්‍යාපන ආයතනය

ශ්‍රී ලංකාව

# ව්‍යාවසායකත්ව අධ්‍යයනය

## ගුරු මාර්ගෝපදේශය

10 ශ්‍රේණිය

ප්‍රථම මුද්‍රණය 2014

ජාතික අධ්‍යාපන ආයතනය

ISBN

වාණිජ දෙපාර්තමේන්තුව,

විද්‍යා හා තාක්ෂණ පීඨය,

ජාතික අධ්‍යාපන ආයතනය.

## අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවුඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව මගින් නිර්දේශ කරන ලද ජාතික මට්ටමේ නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිතව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ අධ්‍යාපනය වෙනුවට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර, වර්ෂ 2007 දී ශ්‍රී ලංකාවේ ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදී.

නව විෂයමාලා චක්‍රයේ දෙවන අදියර 2015 වර්ෂයේ දී පළමුවන, හයවන සහ දහවන ශ්‍රේණි සඳහා හඳුන්වාදීම කළ යුතුව තිබේ. මේ සඳහා පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද අධ්‍යාපනය පිළිබඳව අවධානය යොමු කරන විවිධ පාර්ශවයන්ගේ යෝජනාවන් ද පදනම් කොට ගෙන විෂය නිර්දේශ තාර්කීකරණය කිරීමේ ක්‍රියාවලියක් ජාතික අධ්‍යාපන ආයතනය විසින් හඳුන්වා දෙනු ලැබීය. මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියලුම විෂයයන්ගේ නිපුණතා මට්ටම්, පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූලව ගොඩ නැගීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිතා කරන ලදී. විවිධ විෂයයන්හි දී එකම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත්වීම හැකිතාක් අවම කිරීම, වැඩි බර පැටවීම් වලින් යුක්ත විෂය අන්තර්ගතයන් අඩු කිරීම, සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය භාවිතා කර ඇත.

ගුරු භවතුන් සඳහා පාඩම් සැලසුම් කිරීම, ඉගැන්වීම, ක්‍රියාකාරකම් කරගෙන යෑම, මැනීම් හා ඇගයීම් යනා දී අංශයන් සඳහා අවශ්‍යවන්නා වූ මාර්ගෝපදේශයන් ලබාදීමේ අරමුණින් මෙම නව ගුරු මාර්ගෝපදේශය හඳුන්වා දී ඇත. පංති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශයන් උපකාරී වනු ඇත. සිසුන්ගේ නිපුණතාවයන් වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමගින් ලබා දී තිබේ. එමෙන්ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නොවේ. එමනිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායීවීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමඟ සමගාමීව භාවිතා කිරීම අත්‍යවශ්‍ය වේ. තාර්කීකරණය කරන ලද විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා අලුතින් සංවර්ධනය කර ඇති පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් සිසු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට වෙනස්වීම තුළින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතා හා කුසලතාවන්ගෙන් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීමය.

මෙම ගුරු මාර්ගෝපදේශය සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය ද ආයතනයේ සභාව ද නන් අයුරින් දායකත්වය ලබා දුන් සියලුම සම්පත්දායකයින් හා අනිකුත් පාර්ශවයන්ගේ ඉමහත් කැපවීම ඇගැයීමට ද මෙය අවස්ථාවක් කර ගනු කැමැත්තෙමි.

**අධ්‍යක්ෂ ජනරාල්**
**ජාතික අධ්‍යාපන ආයතනය**

## නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවුඩය

අතීතයේ සිටම අධ්‍යාපනය නිරන්තරයෙන් වෙනස්වීම් වලට භාජනය වෙමින් ඉදිරියට ගමන් කරමින් තිබුණි. මෑත යුගයේ මෙම වෙනස්වීම දැඩි ලෙස සීඝ්‍ර වී ඇත. ඉගෙනුම් ක්‍රමවේදවල මෙන් ම තාක්ෂණික මෙවලම් භාවිතය අතින් හා දැනුම උත්පාදනය සම්බන්ධයෙන් ද ගත වූ දශක දෙක තුළ විශාල පිබිදීමක් දක්නට ලැබුණි. මේ අනුව ජාතික අධ්‍යාපන ආයතනය ද 2015ට අදාළ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සඳහා අප්‍රමාදව සුදුසු පියවර ගනිමින් සිටී. ගෝලීයව සිදුවන වෙනස්කම් ගැන හොඳින් අධ්‍යයනය කර දේශීය අවශ්‍යතා අනුව අනුවර්තනයට ලක්කර ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම්-ඉගැන්වීම් ප්‍රවේශය පාදක කර ගනිමින් නව විෂයමාලාව සැලසුම් කර පාසල් පද්ධතියේ නියමුවන් ලෙස සේවය කරන ගුරු භවතුන් වන ඔබ වෙත මෙම ගුරු මාර්ගෝපදේශය පුද කරන්නේ ඉතා සතුටිනි.

මෙවැනි නව මග පෙන්වීමේ උපදේශන සංග්‍රහයක් ඔබ වෙත ලබාදෙන්නේ ඒ මගින් ඔබට වඩා හොඳ දායකත්වයක් ලබාදිය හැකිවේය යන විශ්වාසය නිසා ය.

මෙම උපදේශන සංග්‍රහය පන්ති කාමර ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ඔබට මහඟු අත්වැලක් වනවාට කිසිම සැකයක් නැත. එසේම මෙය ද උපයෝගී කර ගනිමින් කාලීන සම්පත් ද්‍රව්‍ය භාවිතයෙන් වඩාත් සංවර්ධනාත්මක ප්‍රවේශයක් ඔස්සේ පන්ති කාමරය හසුරුවා ගැනීමට ඔබට නිදහස ඇත.

ඔබ වෙත ලබාදෙන මෙම ගුරු මාර්ගෝපදේශය මැනවින් අධ්‍යයනය කර වඩා නිර්මාණශීලී දරු පරපුරක් බිහි කර ශ්‍රී ලංකාව ආර්ථික හා සමාජීය අතින් ඉදිරියට ගෙන යාමට කැපවීමෙන් යුතුව කටයුතු කරනු ඇතැයි මම විශ්වාස කරමි.

මෙම ගුරු මාර්ගෝපදේශය නිර්මාණය වුයේ මෙම විෂය ක්ෂේත්‍රයට අදාළ ගුරු භවතුන් හා සම්පත් පුද්ගලයින් රැසකගේ නොපසුබට උත්සාහය හා කැපවීම නිසා ය.

අධ්‍යාපන පද්ධතියේ සංවර්ධනය උදෙසා නිම වූ මෙම කාර්යය මා ඉතාමත් උසස් ලෙස අගය කරන අතර මේ සඳහා කැපවී ක්‍රියා කළ ඔබ සැමට මගේ ගෞරවාන්විත ස්තුතිය පිරි නමමි.

එම්.එෆ්.එස්.පී. ජයවර්ධන
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
(විද්‍යා හා තාක්ෂණ පීඨය)

**උපදේශකත්වය හා අනුමැතිය** : ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය
ජාතික අධ්‍යාපන ආයතනය.

**විෂය සම්බන්ධීකරණය** : ඩබ්.එම්.ජ්.බී. විජේසූරිය
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
- වාණිජ දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය.

**ලේඛක මණ්ඩලය** : **අභ්‍යන්තර දායකත්වය**
ඩබ්.එම්.ජ්.බී. විජේසූරිය
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
එම්.ජ්.අයි.පී. පෙරේරා
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
කේ. ප්‍රබාහරන්
කථිකාචාර්ය
එස්.ආර්. රත්නජීව
සහකාර කථිකාචාර්ය,

**බාහිර දායකත්වය** :
නීලමනී මෙන්ඩිස්
(හිටපු ) ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය
ඩී.එස්. රාජපක්ෂ
ශ්‍රී.ලං.විදුහල්පති සේවය
ස/බල/ උඩගම ම.වි. බලංගොඩ
සිරිමා නානායක්කාර - ගුරු උපදේශක
කලාප අධ්‍යාපන කාර්යාලය - වරකාපොල
ජ්.එච්.එම්. බුහාරි - ගුරු උපදේශක
සී.එම්.එස්. නවාස් - ගුරු උපදේශක - ඉබ්බාගමුව

**භාෂා සංස්කරණය** : එම්.ඩබ්.වී. ප්‍රසන්න විජේවර්ධන
ශ්‍රී ලං . ගුරු සේවය
බප/හෝ/මුල්ලේගම ම.වි. - හෝමාගම

# ගුරු අත්පොත පරිශීලනය කිරීම සඳහා උපදෙස්

ව්‍යාවසායකත්ව අධ්‍යයන විෂයය වර්ෂ 2007 දී ක්‍රියාත්මක කරන ලද විෂයමාලා ප්‍රතිසංස්කරණය යටතේ ශ්‍රී ලංකාවේ පාසල් පද්ධතියේ ජ්‍යෙෂ්ඨ ද්විතීයික මට්ටමේ 10 හා 11 ශ්‍රේණි සඳහා හඳුන්වා දෙනු ලැබූ නවතම විෂයයක් විය. ව්‍යාවසායකත්ව අධ්‍යාපනය පාසල්වල ක්‍රියාත්මක වීම නව සහශ්‍රකයේ ගෝලීය ප්‍රවණතාවක් ලෙස හැඳින්විය හැකිය. ව්‍යාවසායකත්ව කුසලතාව පුද්ගලයන් තුළ ඇති හා ගොඩ නැගිය හැකි ඉතා වටිනා ඉහළ මට්ටමේ කුසලතාවකි. ව්‍යාවසායකත්වය පුද්ගලයන් හිතන ආකාරය හා ඒ අනුව ක්‍රියාකරන ආකාරය පිළිබඳ දෙයක් වේ. මේ නිසා ව්‍යාවසායකත්ව අධ්‍යාපනය මගින් පුද්ගලයන් තුල චින්තන විප්ලවයක් ඇති කොට ඔවුන් විශාල ආකල්පමය වෙනසකට භාජනය කළ හැකිය. ඒ අනුව ඔවුන් රටක සමාජීය හා ආර්ථික ප්‍රතිලාභ අත්කර දීම සඳහා දායක කර ගත හැකිය. මෙහි දී ව්‍යාවසායකත්ව ගුරු භූමිකාවට විශාල වගකීමක් පැවරේ. සිසුන්ට ව්‍යාවසායකත්ව අධ්‍යාපනය ලබා දීමේ දී ගුරුවරු සම්ප්‍රදායික ගුරු භූමිකාවෙන් මිදීමටත් , සිසුන් සක්‍රීය ඉගෙනුම් ලබන්නන් පිරිසක් බවට පත් කිරීමටත් සිදුවේ. හැම විටම ගවේෂණාත්මක හා විමසුම්සහිත ඉගෙනුම් ප්‍රවේශයක් අනුගමනය කරමින් ක්‍රියාකාරකම් මත පදනම් ව පාඩම් සැලසුම් කර ගැනීමට ගුරුවරු සූදානම් වී වැදගත්ය. ගුරු මාර්ගෝපදේශය තුළ විෂය නිර්දේශයේ සෑම නිපුණතා මට්ටමකටම අදාළ ව ඉගෙනුම් - ඉගැනීම් ක්‍රියාවලිය සඳහා ක්‍රියාකාරකම් යෝජනා කර තිබේ. එම ක්‍රියාකාරකම් පිළිබඳ ව අධානය යොමු කොට අපේක්ෂිත ඉගෙනුම් ඵල ලඟා කර ගන්නා ආකාරයට පාඩම් සැලසුම් කර ගැනීම කෙරේ යොමු වීම වැදගත් වේ. ඊට අමතර වශයෙන් මෙහි යෝජිත ක්‍රියාකාරකම් මත පමණක් නොරැඳී ගුරුවරුන්ට හුරුපුරුදු ක්‍රියාකාරකම් හා ක්‍රමශිල්ප යොදා ගැනීම ද මැනවි. කෙසේ වුව ද ව්‍යාවසායකත්ව අධ්‍යාපනය ලබන සිසුන් 10 හා 11 ශ්‍රේණි අදාළ පාඨමාලාව අවසානයේ ඔවුන් තුළ ව්‍යාවසායකත්වය පිළිබඳ ඇල්මක් ඇති වී ව්‍යාවසායකයින් ලෙස සිතන පිරිසක් බවට පත්වී ම අපේක්ෂා කෙරේ.

යුරෝපා කොමිසමට අයත් සෑම රටකම පාහේ ප්‍රාථමික අවධායේ සිට ම ව්‍යාවසායකත්ව අධ්‍යාපනය ක්‍රියාත්මක වේ. එම කොමිසම විසින් ප්‍රකාශිත "ව්‍යාවසායකත්ව අධ්‍යාපනය - ගුරුවරුන් සඳහා වූ මාර්ගෝපදේශය" මගින් යමෙක් ව්‍යාවසායකත්ව ගුරුවරයෙක් වන්නේ කෙසේද ? යන්න දැක්වීමේ දී පහත සඳහන් අවශ්‍යතා පිළිබඳ ව අවධානය යොමු කර ඇත. මේ පිළිබඳ ව ඔබ ද අවධානය යොමු කිරීම වැදගත් වේ.

* ව්‍යාසායකත්ව අධ්‍යපනය හුදෙක් ව්‍යාපාරයක් කර ගෙන යන්නේ කෙසේද ? යන්නට වඩා වැඩි දෙයකි. එය ව්‍යාවසායකත්ව ආකල්ප කුසලතා හා දැනුම සංවර්ධනය කර ගන්නේ කෙසේද යන්න පිළිබඳව දෙයක් වේ. කෙටියෙන් දක්වනවා නම් එය අදහස් ක්‍රියාකාරී බවට පත්කර ගැනීමට හැකියාව ලබා දීමය.

* ගුරුවරු තමන් ව්‍යාවසායකයින් බවට පත් නොවී ව්‍යාවසායකයින් බවට පත්වන්නේ කෙසේදැයි ඉගැන්විය නොහැකිය.

* සිසුන් තුළ නිර්මාණශීලිත්වය හා නවෝත්පාදනය ප්‍රදර්ශනය වීම සඳහා සිසුන් සක්‍රීය ක්‍රමවේදවල යෙද වීමට හැකි ව්‍යාවසායකත්ව නිපුණතා අවශ්‍ය කෙරේ.

* ව්‍යාවසායකත්ව නිපුණතා හා කුසලතා අත්පත් කර ගත හැකි විනනේ ප්‍රායෝගික හා සැබෑ ජීවන නිපුණතා ඔස්සේ පමණි.

* සියලුම විෂයයන් ඔස්සේ මෙන්ම වෙනම වූ විෂයයන් මගින් ද ව්‍යාවසායකත්ව කුසලතා ලබා දිය හැකිය.

* ව්‍යාවසායකත්වය සමාගම් තුළ මෙන්ම රාජ්‍ය ආයතන තුළ ද භාවිතයට ගැනෙන බැවින් ව්‍යවසායකත්ව අධ්‍යාපනයේ දී ව්‍යාවසායකයින් මෙන්ම අභ්‍යන්තරික ව්‍යාවසායකයින් කෙරේ ද අවධානය යොමු කළ යුතුය.

* ව්‍යාවසායකත්ව අධ්‍යාපනය සැබැවින්ම ග්‍රහණය කර ගැනීම සඳහා අධ්‍යාපනයේ සෑම මට්ටයමකදී ම ව්‍යාවසායකත්වයට අදාළව ඉගෙනුම් ඵල තක්සේරුකරණ ක්‍රම හා තත්ත්ව ආරක්ෂණ ක්‍රියාපටිපාටි සංවර්ධනය කිරීමට අවශ්‍ය වේ. මේවා සැලසුම් කළ යුත්තේ ගුරුවරුන් තුළ ව්‍යාවසායකත්ව දැනුම, කුසලතා හා ආකල්ප සතු කර ගැනීමට උපකාර වන ආකාරයෙනි.

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ව්‍යාවසායකත්ව අධ්‍යයනයට අදාළ පෙළපොතේ ඒ ඒ නිපුණතාවලට අදාළ පාඩම්වල අන්තර්ගතය පිළිබඳව මනා වැටහීමක් ලබා ගැනීම වැදගත්ය. ඒ අනුව මෙම ගුරු අත්පොතට සමගාමීව පෙළපොත ද පරිහරණය කරමින් ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කර ගත යුතු වේ.

**විෂය සමායෝජක**

**පටුන** **පිටු අංකය**


| | |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවුඩය | iii |
| සහකාර අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවුඩය | iv |
| විෂයමාලා කමටුව | v |
| ගුරු අත්පොත පරිශීලනය කිරීම සඳහා උපදෙස් | vi |
| විෂය නිර්දේශයේ අන්තර්ගතය | ix |
| ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් | 1 - 50 |

# විෂය නිර්දේශයේ අන්තර්ගතය

## හැඳින්වීම

ව්‍යවසායකත්ව අධ්‍යාපනයේ සමස්ත අරමුණ වන්නේ ව්‍යවසායකත්ව ආකාරයකින් හැසිරීම සඳහා ශිෂ්‍යයන්ට දැනුම, ආකල්ප හා කුසලතා ලබාදීමය. ව්‍යවසායකත්ව අධ්‍යයන විෂයය, ජ්‍යෙෂ්ඨ ද්විතියික මට්ටමේ 10 සහ 11 ශ්‍රේණිවල සිසුන්ට ඉගෙන ගැනීම සඳහා තෝරාගත හැකි විෂයයක් වේ. මෙම විෂයය 2007 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කරන ලද අධ්‍යාපන ප්‍රතිසංස්කරණයේ දී ජ්‍යෙෂ්ඨ ද්විතීයික විෂයමාලාවේ 10 සහ 11 ශ්‍රේණි සඳහා හඳුන්වා දෙනු ලැබූ නවතම විෂයයක් වේ. ව්‍යවසායකත්ව අධ්‍යයනය විෂයය ඉගෙන ගැනීමෙන් අධ්‍යාපනය තුළින් වර්ධනය කිරීමට අපේක්ෂා කරන පොදු නිපුණතාවන් වන පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා සහ වැඩ ලෝකයට සූදානම්වීමේ නිපුණතා මැනවින් සාක්ෂාත් කර ගැනීමට සිසුන්ට අවස්ථාව ලැබේ. ව්‍යවසායකත්ව අධ්‍යාපනය යාවජීව අධ්‍යාපනයකි. එමෙන්ම ව්‍යවසායකත්ව අධ්‍යාපනය 21 වන සියවසේ ලෝකයේ නවරැල්ලකි. මේ වන විටත් යුරෝපා කොමිසමට ඇතුළත් රටවල සෑම රටක්ම පාහේ සිසුන්ට ප්‍රථමික අධ්‍යාපනයේ සිට ම ව්‍යවසායකත්ව අධ්‍යාපනය ලබා දීම පිණිස ප්‍රතිපත්තිමය වශයෙන් තීරණ ගෙන ක්‍රියාත්මක වෙමින් පවතී. මෙම විෂයය ඉගෙන ගැනීමට සැලැස්වීමෙන් 21 වන සියවසේ එළඹෙන ගෝලීය අභියෝගවලට මුහුණ දීම සඳහා සිසුන් සූදානම් කළ හැකිවේ.

මෙම විෂයයේ ආරම්භක අවස්ථාව ලෙස දැක්විය හැක්කේ ශ්‍රී ලංකාවේ කනිෂ්ඨ ද්විතියික විෂය මාලාවේ 6-9 ශ්‍රේණි දක්වා ක්‍රියාත්මක වන ප්‍රායෝගික හා තාක්ෂණ විෂයයයි. එම විෂයයන් ඉගෙන ගන්නා සිසුන් හට ව්‍යවසායකත්වය පිළිබඳ පදනම් අවබෝධයක් ලැබෙන අතර එම සිසුන්ට 10 සහ 11 ශ්‍රේණිවල දී ව්‍යවසායකත්ව අධ්‍යනය විෂයය ඔස්සේ තවදුරටත් ස්වකීය දැනුම, ආකල්ප හා කුසලතා ව්‍යාප්ත කර ගැනීමට ඉඩප්‍රස්තාව ලැබේ. ඉන් අනතුරුව උසස් පෙළ ව්‍යාපාර අධ්‍යයනය විෂයය ඉගෙන ගැනීමේ දී ව්‍යවසායකත්වය පිළිබඳ ව තවදුරටත් අධ්‍යයනය කිරීමට අවස්ථාව සලසා තිබේ. එම සිසුන් උසස් අධ්‍යාපනයට පිවිසීමේ දී විශ්ව විද්‍යාලවල ද මේ සඳහා ඉඩ ප්‍රස්තා තිබේ.

2007 වර්ෂයේ දී ක්‍රියාත්මක කරන ලද ව්‍යවසායකත්ව අධ්‍යයනය විෂයය පන්ති කාමරය තුළ ක්‍රියාත්මක වීම පිළිබඳ ව සිදු කරන ලද පර්යේෂණ මගින් අනාවරණය වූ තොරතුරු ද ක්ෂේත්‍රයෙන් ලබා ගත් අත්දැකීම් ද සැලකිල්ලට ගනිමින් පැවති මෙම විෂයය සිසුන්ට ඉතා ප්‍රියජනක විෂයයක් බවට පත් කිරීම සඳහා මෙවර යම් යම් වෙනස්කම්වලට භාජනය කොට විෂයය නවීකරණයකට බඳුන් කරන ලදී. ප්‍රධාන වශයෙන් විෂය සන්ධාරයේ ගැඹුර තවදුරටත් අඩු කරන ලද අතර, වඩාත් තාර්කික අයුරින් නිපුණතා හා උපනිපුණතා පෙළගස්වා එයට උචිත අයුරින් විෂය සන්ධාරය සංවිධානය කර තිබේ. ව්‍යාවසායකත්වය ඉගෙන ගැනීම පුද්ගලයන්ට හා රටකට කෙතරම් ප්‍රයෝජනවත් වුවත්, 10 ශ්‍රේණියට ඇතුළත්වන සිසුන් තෝරා ගැනීම සාපේක්ෂ වශයෙන් අඩු මට්ටමක පවතී. එසේ හෙයින් මෙම විෂයය තෝරා ගැනීමට ඉඩ ප්‍රස්තා ලබාදීම අධ්‍යාපන බලධරයන්ගේ ද, ගුරුවරුන්ගේ ද වගකීමක් කොට සැලකීමට හැකිවේ. ඒ අනුව මෙම විෂයය තෝරා ගැනීම සඳහා සිසුන් උනන්දු කිරීමට විෂය ඉගැන්වීම සඳහා ගුරුවරු උනන්දු කිරීමටත් වාණිජ විද්‍යා අධ්‍යක්ෂවරු, විෂය සංවර්ධන අධ්‍යක්ෂවරු, විදුහල්පතිවරු හා අංශභාර ගුරුවරු පියවර ගැනීම කාලෝචිත ක්‍රියාවක් වේ.

**ජාතික පොදු අරමුණු**

I මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩ නැඟීම සහ ශ්‍රී ලාංකීය අනන්‍යතාව තහවුරු කිරීම

II වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැගි දායාදයන් හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම

III මානව අයිතිවාසිකම් ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයාංගම බැඳීමකින් යුතුව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණ කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම

IV පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත් සහ මානව අගයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම

V සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම

VI පුද්ගලයාගේ සහ ජාතියේ ජීවගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායි කාර්යයන් සඳහා අධ්‍යාපන තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම

VII ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩගැස්වීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම

VIII ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම

**ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ වාර්තාව (2003 දෙසැම්බර්)**

## පොදු නිපුණතා සමූහ

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු මුදුන්පත් කර ගැනීමට දායක වනු ඇත.

(i) **සන්නිවේදන නිපුණතා**

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණය ප්‍රවීණත්වය යන අනුකාණ්ඩ හතරක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

**සාක්ෂරතාව** : සාවධානව ඇහුම්කන් දීම, පැහැදිලි ව කතා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම. ඵලදායී අයුරින් අදහස් හුවමාරු කර ගැනීම.

**සංඛ්‍යා පිළිබඳ දැනුම** : භාණ්ඩ, අවකාශය හා කාලය, ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය.

**රූපක භාවිතය** : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගලපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම.

**තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය**: පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද සේවා පරිශ්‍රයන් තුළ දී ද පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම.

(ii) **පෞරුෂත්ව වර්ධනය අදාළ නිපුණතා**

- නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තිය, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම වැනි අගයයන්.
- චිත්තවේගී බුද්ධිය.

(iii) **පරිසරයට අදාළ නිපුණතා**

මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයන්ට අදාළ වේ.

**සමාජ පරිසරය** : ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායයන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්.

**ජෛව පරිසරය** : සජීවී ලෝකය, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස්වැල්, වනාන්තර, මුහුදු, ජලය, වාතය සහ ජීවය- ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා.

**භෞතික පරිසරය** : අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මළපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදීතාව හා කුසලතාව. ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගු වේ.

(iv) **වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා**

ආර්ථික සංවර්ධනයට දායක වීම.
තම වෘත්තීය ලැදියා සහ අභියෝගතා හඳුනා ගැනීම.
හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ ඵලදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම.
යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා.

(v) **ආගම සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතා**

පුද්ගයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාරධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය.

(vi) **ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා**

සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්.

(vii) **"ඉගෙනීමට ඉගෙනීම" පිළිබඳ නිපුණතා**

ශීඝ්‍රයෙන් වෙනස් වන, සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීනව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයින් හට ශක්තිය ලබාදීම.

**විෂයය අරමුණු**

01. ව්‍යවසායකත්වයට අදාළ මූලික සංකල්ප හා නිපුණතා පිළිබඳ ව දැනුවත්භාවය ලබාදීම.
02. ව්‍යාපාර කටයුතුවල ස්වභාවය හා ව්‍යාපාරවල ආර්ථික හා සමාජීය අවශ්‍යතාව පිළිබඳ මූලික අවබෝධයක් ලබාදීම.
03. ව්‍යවසායකත්වය කෙරේ ඇල්මක් ඇතිවී එහි සැබෑ ක්‍රියාකාරිකයකු කරවීම.
04. සමාජයේ කවර හෝ පුද්ගල භූමිකාවක සාර්ථක ලෙස කටයුතු කිරීමේ හැකියාව ලබාදීම සඳහා ව්‍යවසායකත්ව නිපුණතා අත්පත් කරදීම.
05. ව්‍යවසායකත්ව අධ්‍යාපන ක්ෂේත්‍රයේ වැඩිදුර අධ්‍යයන කටයුතුවල හා වෘත්තියක නියැලීම සඳහා අවශ්‍ය කෙරෙන පදනම් දැනුමක් ලබාදීම.
06. සමබර පෞරුෂයකින් හා ඉහළ කාර්ය සාධනයකින් යුත් පුද්ගලයෙකු බවට පත් කිරීම.
07. ගතික ව්‍යාපාර පරිසරයට උචිත ලෙස අනුවර්තනය වෙමින් සාර්ථක ව්‍යවසායකයෙකු වශයෙන් කටයුතු කිරීමේ හැකියාව ලබාදීම.
08. ව්‍යාපාර කිරීම සඳහා සාර්ථක ප්‍රවේශයක් ලබාදීම හා රැකියා නිර්මාණය කරන පුද්ගලයකු බිහිකිරීම.
09. දේශීය සම්පත් භාවිතයෙන් ශ්‍රී ලංකා ආර්ථික සංවර්ධනයට ඉහළ එකතු කළ වටිනාකමක් ලබා දෙන පුද්ගලයෙකු බිහිකිරීම.
10. ආර්ථික හා සමාජයීය වශයෙන් ඉහළ ප්‍රතිලාභ භුක්ති විඳින ආත්ම අභිමානයෙන් යුත් පුද්ගලයෙකු බිහිකිරීම.

## තක්සේරුකරණය හා ඇගයීම

### පාසල් මට්ටම

ව්‍යවසායකත්වය ඉතා ප්‍රායෝගික සමාජයීය විද්‍යා විෂයයකි. එම විෂයයේ ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය හැකි තරම් ශිෂ්‍ය කේන්ද්‍රීයව ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන අතර, එයට උචිත තක්සේරුකරණ වැඩපිළිවෙළක් පාසල මගින් සැලසුම් කළ යුතු වේ. එහි දී ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලියට සමගාමී ව තක්සේරුකරණය ද සිදු කළ යුතු අතර, පාසල පදනම් කරගත් ඇගයීම් වැඩපිළිවෙළ යටතේ (SBA) ඇගයීම් උපකරණ නිර්මාණය කිරීමේ දී උචිත නිර්ණායක ගොඩනගා ගෙන තක්සේරුකරණය සිදු කළ හැකි ය. මෙම විෂයය සඳහා සැලසුම් කරන ලද ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ යෝජිත ක්‍රියාකාරකම්වල අපේක්ෂිත ඉගෙනුම් ඵල මැනෙන ආකාරයට තක්සේරුකරණය ද, ඇගයීම ද සිදු වීම අපේක්ෂා කෙරේ. වර්ෂ අවසාන වාර පරීක්ෂණ සඳහා ප්‍රශ්න පත්‍ර පිළියෙල කිරීමේ දී පහත සඳහන් ප්‍රශ්න පත්‍ර ආකෘතිය හා ව්‍යුහය අනුගමනය කෙරේ යැයි අපේක්ෂා කෙරේ.

ව්‍යවසායකත්ව අධ්‍යයනය පත්‍රය I සහ පත්‍රය II වශයෙන් පැය 3 ක් තුළ පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්න පත්‍ර දෙකකි.

10 ශ්‍රේණිය

**පත්‍රය I -** නිපුණතා 4 දක්වා ආවරණය වන පරිදි බහුවරණ ප්‍රශ්න 25 කින් සමන්විත ප්‍රශ්න පත්‍රයකි.
ලකුණු 25 x 2 = 50

**පත්‍රය II -** නිපුණතා 4 දක්වා ආවරණය වන පරිදි ව්‍යුහගත ප්‍රශ්න 6 කින් සමන්විත වේ. සිසුන් ප්‍රශ්න 5 කට පිළිතුරු සැපයිය යුතු ය.
ලකුණු 10 x 5 = 50

11 ශ්‍රේණිය

**පත්‍රය I -** සමස්ත විෂය නිර්දේශයම ආවරණය වන පරිදි පිළියෙල කරන ලද වාස්තවික වර්ගයේ (බහුවරණ ප්‍රශ්න සහ කෙටි පිළිතුරු ප්‍රශ්න) ප්‍රශ්න 40 කින් සමන්විත ප්‍රශ්න පත්‍රයකි. ලකුණු 40 කි.

**පත්‍රය II -** සමස්ත විෂය නිර්දේශයම ආවරණය වන පරිදි පිළියෙල කරන ලද ව්‍යුහගත රචනා ශෛලියේ ප්‍රශ්නවලින් සමන්විත ප්‍රශ්න 7 කි. සිසුන් ප්‍රශ්න 5 කට පමණක් පිළිතුරු සැපයිය යුතු වේ. එක් ප්‍රශ්නයකට ලකුණු 12 බැගිනි. ප්‍රශ්න 05 ට ලකුණු 60කි.
ප්‍රශ්න පත්‍ර 1 සහ 11 සඳහා මුළු කාලය පැය 3 කි. මුළු ලකුණු ප්‍රමාණය 100 කි.

**II** වන ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහගත ප්‍රශ්න සකස් කිරීමේ දී හැකි සෑම අවස්ථාවක දී ම සිද්ධි පදනම් කරගෙන ප්‍රශ්න නිර්මාණය කිරීමට යෝජනා කෙරේ. ප්‍රශ්න පත්‍රයේ සෑම ප්‍රශ්නයක් ම අපේක්ෂිත ඉගෙනුම් ඵල සාධනය වන අයුරින් නිර්මාණය කිරීම අපේක්ෂිත ය.

## 7.0 යෝජිත නිපුණතා, නිපුණතා මට්ටම්, විෂය අන්තර්ගතය, ඉගෙනුම් ඵල හා කාලච්ඡේද - 10 ශ්‍රේණිය

| නිපුණතාව | නිපුණතා මට්ටම | අන්තර්ගතය | bf.kqï M, | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 1 **ව්‍යවසායකත්වය හා එහි වැදගත්කම අවබෝධ කොට ගෙන ව්‍යවසායකයෙකු වීමේ ඇල්ම ප්‍රදර්ශනය කරයි.** | | | | **30** |
| | 1.1 ව්‍යවසායකත්ව සංකල්පය විග්‍රහ කරයි. | • **ව්‍යවසායකත්වය**<br>• ව්‍යවසායකත්වය හැඳින්වීම<br>• ව්‍යවසායකත්වය හා බැඳි මූලික සංකල්ප හැඳින්වීම - නිර්මාණශීලීත්වය, නවෝත්පාදන බව, අවදානම් දැරීම<br>• මානව සම්පතක් ලෙස ව්‍යවසායකත්වයේ සුවිශේෂත්වය හා වැදගත්කම | • ව්‍යවසායකත්වය පිළිබඳ ව ස්වකීය අදහස ප්‍රකාශ කරයි.<br>• ව්‍යවසායකත්ව සංකල්පය හා බැඳුණු මූලික පද ලිහිල් බසින් පැහැදිලි කරයි.<br>• සෙසු සම්පත්වලට සාපේක්ෂව ව්‍යවසායකත්වයෙහි සුවිශේෂත්වය සාකච්ඡා කරයි. | 09 |
| | 1.2 ව්‍යවසායකත්වය හා ව්‍යාපාර අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාව විමසයි | • **ව්‍යවසායකත්වය හා ව්‍යාපාර අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාව**<br>• ව්‍යාපාර හා ව්‍යාපාරිකයා හැඳින්වීම<br>• ව්‍යවසායකයා හා ව්‍යාපාරිකයා අතර සමානතා<br>• ව්‍යාපාරිකයා හා ව්‍යවසායකයා අතර වෙනස<br>• ව්‍යවසායකයින්ගේ විවිධ පැතිකඩ (Various dimension of entrepre neurs)<br>  • ව්‍යාපාර ව්‍යවසායකයින්<br>  • සමාජයීය ව්‍යවසායකයින්<br>  • අභ්‍යන්තරික ව්‍යවසායකයින් | • ව්‍යාපාරවල ස්වභාවය සාකච්ඡා කරයි.<br>• ව්‍යාපාරිකයා හා ව්‍යවසායකයා අතර සමානකම් ද වෙනස්කම් සසඳයි.<br>• ව්‍යවසායකයින් වර්ග නිදසුන් දක්වමින් පැහැදිලි කරයි. | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 1.3 ව්‍යවසායකයින්ගේ සුවිශේෂ ගතිලක්‍ෂණ විමර්ශනය කරයි. | • **ව්‍යවසායකයින්ගේ සුවිශේෂ ගතිලක්ෂණ**<br>• නිර්මාණශීලී බව Creativity<br>• නවෝත්පාදන බව - Innovativeness<br>• අවදානම් භාර ගැනීම - Risktaking<br>• දැක්මක් සහිත බව -Visionary<br>• පරිසර සංවේදී බව හා අවස්ථා හඳුනා ගැනීම - Environmental sensitivity and Recognition of opportunities.<br>• සුභවාදී වීම - Optimistic<br>• අසීරු අරමුණු ඉටුකර ගැනීම කෙරේ නැඹුරුව - Achievement orientation<br>• ස්වකීය සාර්ථකත්වය තමා අනුව තීරණය වන බව පිළිබඳ විශ්වාසය - Internal locus of control<br>• ස්වාධීනත්වය - Autonomy<br>• නම්‍යශීලීත්වය - Flexbility<br>• දැඩි ආශාව - Passion<br>• ආරම්භනය - Initiative | • දෙන ලද පුද්ගල ගතිලක්ෂණ අතුරෙන් ව්‍යවසායකයන්ට සුවිශේෂ වූ ගතිලක්ෂණ වෙන් කොට දක්වයි.<br>• ව්‍යවසායකත්ව ගතිලක්ෂණ ස්වකීය ගතිලක්ෂණ සමග ගළපමින් තමා තුළ පවත්නා ව්‍යවසායකත්ව ගතිලක්ෂණ ඉස්මතු කොට දක්වයි.<br>• දෙන ලද ව්‍යවසායකත්ව ගතිලක්ෂණ විග්‍රහ කරයි. | 09 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 1.4 ව්‍යවසායකත්වයේ ප්‍රතිලාභ විමසයි. | • ව්‍යවසායකයින්ගේ සාමාන්‍ය ගතිලක්ෂණ<br>නිදසුන් :<br>කැපවීම Dedicatio<br>සාමාන්‍ය වැටහීම Common sense<br>ස්වයං පෙළඹවීම Self motivation<br>ආත්ම විශ්වාසය Self confidence<br>තොරතුරු සොයා බැලීම Information seeking<br><br>• ව්‍යවසායකත්වයේ ප්‍රතිලාභ<br>• ව්‍යවසායකයාට ලැබෙන ප්‍රතිලාභ<br>• ස්වකීය දෛවය තීරණය වීම.<br>• කාර්යයන්හි විවිධත්වයක් ඇතිවීම<br>• පූර්ණ විභව්‍යතා සාධනය කරගත හැකිවීම<br>• ස්වයංපෝෂිත බව<br>• වර්ධනය සඳහා පුද්ගලයන්ට උපරිම අවකාශ ලැබීම.<br>• ආකර්ශණීය ලාභයක් ඉපයීම<br>• සමාජ සුභසාධනය සඳහා දායක විය හැකිවීම<br>• නිදහස සහ ඉතා ඉහළ ආත්ම පරිපූර්ණත්වයකට පත්වීම | • කිසියම් පුද්ගලයෙක් ව්‍යවසායකයෙකු වීමෙන් ඔහුට අත්විඳිය හැකි සුවිශේෂ ප්‍රතිලාභ සාකච්ඡා කරයි.<br>• ඇතැම් පුද්ගලයින් ජීවනෝපායක් ලෙස රැකියාවක් තෝරා ගැනීමට යොමු නොවී ව්‍යාපාර කිරීම සඳහා යොමුවීමට හේතු ඉදිරිපත් කරයි.<br>• දේශීය ආර්ථික සංවර්ධනය සඳහා ව්‍යවසායකයින් දායක වන අයුරු පෙන්වා දෙයි. | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | | • ව්‍යවසායකත්වයෙන් දේශීය ආර්ථිකයකට ලැබෙන ප්‍රතිලාභ<br>• රැකියා උත්පාදනය<br>• සම්පත් උපරිම ලෙස උපයෝජනය කිරීම<br>• පුද්ගලයන්ගේ ජීවන තත්ත්වය උසස් වීම<br>• ප්‍රාදේශීය සංවර්ධනය<br>• නවෝත්පාදන තුළින් නව භාණ්ඩ හා සේවා හඳුන්වාදීම<br>• ආදායම බෙදීයාමේ විෂමතාව අඩුවීම<br>• විදේශ විනිමය ඉපයීම<br>• ස්වෛරී හා නිවහල් ආර්ථිකයක් හා ජාතියක් නිර්මාණය වීම | | **16** |
| **2. කුඩා පරිමාණ ව්‍යාපාරයක ව්‍යාවසායකයකු විසින් ඉටු කරන භූමිකා විමර්ශණය කරයි.** | 2.1 ව්‍යවසායකත්වය හා කුඩා පරිමාණ ව්‍යාපාර අතර ඇති සබඳතාව අනාවරණය කරයි. | • කුඩා පරිමාණ ව්‍යාපාර<br>• කුඩා ව්‍යාපාර හැඳින්වීම<br>• කුඩා ව්‍යාපාර හා ව්‍යවසායකත්වය අතර සම්බන්ධතාව<br>• ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයෙහිලා කුඩා පරිමාණ ව්‍යාපාරවල වැදගත්කම<br>• කුඩා ව්‍යාපාරවල ශක්තීන් හා සීමා<br>• කුඩා ව්‍යාපාර අසාර්ථකවීමට බලපාන හේතු<br>• කුඩා ව්‍යාපාර සාර්ථක කර ගැනීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග | • කුඩා පරිමාණ ව්‍යාපාරවල ගතිලක්ෂණ පැහැදිලි කරයි.<br>• ශ්‍රී ලංකාව වැනි ආර්ථිකයකට කුඩා පරිමාණ ව්‍යාපාර ප්‍රයෝජනවත් වන අන්දම පෙන්වා දෙයි.<br>• කුඩා පරිමාණ ව්‍යාපාර අසාර්ථකවීමට තුඩුදෙන සාධක පිටුදැකීම සඳහා යෝජනා ඉදිරිපත් කරයි. | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 2.2 කුඩා පරිමාණ ව්‍යාපාරයක් තුළ ව්‍යවසායකයකු ඉටු කරන ප්‍රධාන භූමිකා අධ්‍යයනය කරයි. | • **කුඩා පරිමාණ ව්‍යාපාරයක් තුළ ව්‍යවසායකයෙකුගේ ප්‍රධාන භූමිකා**<br>• හැඳින්වීම<br>• ප්‍රධාන භූමිකා<br>  • අයිතිකරු<br>  • නායකයා<br>  • කළමනාකරු<br>• ඉහත භූමිකාවලට අදාළ කාර්යයන් | • ව්‍යවසායකයෙක් ස්වකීය ව්‍යාපාරය තුළ ඉටු කරන ප්‍රධාන භූමිකා පැහැදිලි කරයි.<br>• ව්‍යාපාරයක් තුළ ව්‍යවසායකයකුගේ භූමිකාවලට අදාළ කාර්යයන් සඳහා නිදසුන් දක්වයි.<br>• ව්‍යවසායකයෙකුගේ එක් එක් භූමිකා ව්‍යාපාරයක සාර්ථකත්වයට බලපාන අයුරු සාකච්ඡා කරයි. | 05 |
| | 2.3 කුඩා පරිමාණ ව්‍යාපාරයක් සාර්ථකව පවත්වාගෙන යාම සඳහා ව්‍යවසායකයකු විසින් වර්ධනය කර ගත යුතු කළමනාකරණ හා නායකත්ව කුසලතා අනාවරණය කරයි. | • කළමනාකරණ හා නායකත්ව භූමිකා සාර්ථකව ඉටු කිරීම සඳහ ව්‍යවසායකයකුට තිබිය යුතු මූලික කුසලතා<br>• හැඳින්වීම<br>• තාක්ෂණික<br>• මානව<br>• සංකල්පනාත්මක<br>• කණ්ඩායමක් සමඟ කටයුතු කිරීම<br>• සන්නිවේදනය<br>• උපදේශනය<br>• ආදර්ශමත්ව කටයුතු කිරීම<br>• කණ්ඩායම නියෝජනය කිරීම | • කළමනාකරණ හා නායකත්ව භූමිකා මැනවින් ඉටුකිරීම සඳහා ව්‍යවසායකයකුට තිබිය යුතු මූලික කුසලතා දක්වයි.<br>• දෙන ලද කළමනාකරණ හා නායකත්ව කුසලතා ලුහුඩින් පැහැදිලි කරයි.<br>• කළමනාකරණ හා නායකත්ව කුසලතා ව්‍යාපාරයක සාර්ථකත්වයට හේතු වන අන්දම පෙන්වා දෙයි. | 05 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| **3. ව්‍යවසායකයකු ලෙස ව්‍යාපාර පරිසරය විශ්ලේෂණය කරයි.** | | | | **20** |
| | 3.1 ව්‍යාපාර පරිසර අධ්‍යයනය සඳහා ව්‍යාපාර පරිසර සාධක වෙන් වෙන්ව විමසයි. | • **ව්‍යාපාර පරිසරය**<br>• හැඳින්වීම<br>• ව්‍යාපාර පරිසරය අධ්‍යයනයේ වැදගත්කම<br>• ව්‍යාපාර පරිසරය වර්ග කිරීම.<br>• අභ්‍යන්තර පරිසරය<br>• බාහිර පරිසරය | • ව්‍යාපාර පරිසරය පැහැදිලි කරයි.<br>• ව්‍යවසායකයකු වශයෙන් ව්‍යාපාර පරිසරය ගැන සැලකිලිමත් වීමේ වැදගත්කම සාකච්ඡා කරයි.<br>• අධ්‍යයනයේ පහසුව සඳහා ව්‍යාපාර පරිසරය කොටස් කරයි. | 02 |
| | 3.2 ව්‍යාපාර අභ්‍යන්තර පරිසර බලවේගවල ක්‍රියාකාරීත්වය විග්‍රහ කරයි. | • **අභ්‍යන්තර පරිසරය හා එහි බලපෑම**<br>• අභ්‍යන්තර පරිසරය හා එහි සාධක<br>• අභ්‍යන්තර පරිසර සාධක තුළින් මතුවන ශක්තීන් හා දුර්වලතා | • ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසරය නිදසුන් සහිතව පැහැදිලි කරයි.<br>• ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසරයේ හඳුනා ගන්නා ශක්තීන් ඇගයීමකට ලක් කරයි.<br>• ව්‍යාපාර අභ්‍යන්තර පරිසරයෙන් හඳුනා ගන්නා දුර්වලතාවලට පිළියම් යෝජනා කරයි. | 06 |
| | 3.3 ව්‍යාපාර බාහිර පරිසර බලවේගවල ක්‍රියාකාරීත්වය විග්‍රහ කරයි. | • **බාහිර පරිසරය හා එහි බලපෑම**<br>• බාහිර පරිසරය හා එහි සාධක<br>• බාහිර පරිසර සාධක තුළින් මතුවන අවස්ථා හා තර්ජන | • ව්‍යාපාරයක බාහිර පරිසරය නිදසුන් සහිතව පැහැදිලි කරයි.<br>• ව්‍යාපාරයක බාහිර පරිසරයෙන් හඳුනා ගන්නා අවස්ථා ඇගයීමකට ලක් කරයි.<br>• ව්‍යාපරයක බාහිර පරසරයේ හඳුනා ගන්නා තර්ජනවලට පිළියම් යෝජනා කරයි. | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 3.4 ව්‍යවසායකයෙකු වශයෙන් ශ්‍රී ලංකාවේ ආර්ථිකය පිළිබඳව ගවේෂණය කරයි. | • **ශ්‍රී ලංකා ආර්ථිකයේ ස්වභාවය**<br>• ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ ප්‍රධාන ව්‍යාපාර/ නිෂ්පාදන අංශ<br>• ප්‍රාථමික<br>• ද්විතීයික<br>• තෘතීයික<br>• ශ්‍රී ලංකාවේ සුලභ සම්පත්<br>• පරිසර ප්‍රවණතා | • ශ්‍රී ලංකා ආර්ථිකයේ ප්‍රධාන ව්‍යාපාර අංශ නිදසුන් සහිත ව පැහැදිලි කරයි.<br>• ව්‍යාපාර සඳහා ප්‍රයෝජනයට ගත හැකි ශ්‍රී ලංකාවේ සුලභ සම්පත් සඳහා නිදසුන් දක්වයි.<br>• ව්‍යවසායකයකු වශයෙන් ව්‍යාපාර පරිසර ප්‍රවණතා පිළිබඳව සැලකිලිමත් වීමේ වැදගත්කම සාකච්ඡා කරයි. | 06 |
| **4. යෝග්‍යය ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ පූර්ව සූදානම ප්‍රදර්ශනය කරයි.** | 4.1 ව්‍යාපාරයක් ආරම්භ කිරීමට පෙර ගත යුතු තීරණ අනාවරණය කරයි. | • ව්‍යාපාරයක් ආරම්භ කිරීමට පෙර ගත යුතු වැදගත් තීරණ<br>• ව්‍යාපාරය සඳහා පූර්ණ වශයෙන් කැපවීම.<br>• ව්‍යාපාරයට පදනම් වන භාණ්ඩය හෝ සේවාව<br>• වෙළෙඳපොළ<br>• තරගකාරීත්වය<br>• ඉපයීමේ ප්‍රමාණවත් බව<br>• ප්‍රාග්ධනය සපයා ගැනීම<br>• තනිව හෝ හවුල්ව ආරම්භ කිරීම<br>• ස්ථානය තෝරා ගැනීම | • පුද්ගලයකු ව්‍යාපාරයක් ආරම්භ කිරීමට පෙර ගත යුතු වැදගත් තීරණ සාකච්ඡා කරයි.<br>• පුද්ගලයෙකු ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ දී මතු විය හැකි ගැටළුවලට විසඳුම් යෝජනා කරයි.<br>• ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ දී මතුවිය හැකි ගැටළුවලට දෙන ලද තොරතුරු පදනම් කරගෙන ප්‍රශස්ථ විසඳුම් යෝජනා කරයි. | **24**<br>04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 4.2 නව ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ දී වෙළෙඳපොළට පිවිසිය හැකි විකල්ප ක්‍රම හා උපායමාර්ග විමසයි. | • නව ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ දී වෙළෙඳපළට පිවිසිය හැකි විකල්ප ක්‍රම<br>  • පවතින වෙළෙඳපොළකට පවතින භාණ්ඩ හෝ සේවා<br>  • පවතින වෙළෙඳපොළකට නව භාණ්ඩ හෝ සේවා<br>  • නව වෙළෙඳපොළකට පවතින භාණ්ඩ හෝ සේවා<br>  • නව වෙළෙඳපොළකට නව භාණ්ඩ හෝ සේවා<br>• නව ව්‍යාපාරයක් සඳහා පිවිසුම් උපාය මාර්ග<br>  • සුවිශේෂිත භාණ්ඩයක්/සේවාවක්<br>  • නිෂ්පාදිත ප්‍රභේදනය<br>  • වෙළෙඳපොළ හිදැස<br>  • නවෝත්පාදනය | • ව්‍යවසායකයකුට ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ දී වෙළෙඳපළට ප්‍රවේශ විය හැකි විකල්ප ආකාර දක්වයි.<br>• ව්‍යවසායකයකුට වෙළෙඳපොළකට ප්‍රවේශ විය හැකි විකල්ප ආකාරවල පවත්නා වාසි හා සීමා සාකච්ඡා කරයි.<br>• නව ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ දී වෙළෙඳපළට පිවිසීම සඳහා ව්‍යවසායකයකුට ගත හැකි උපායමාර්ග පැහැදිලි කරයි. | 05 |
| | 4.3 ව්‍යාපාරයක් සඳහා ව්‍යාපාර අදහසක් තෝරයි. | • ව්‍යාපාර අදහසක් තේරීම.<br>  • ව්‍යාපාර අදහස් සංකල්පය<br>  • හොඳ ව්‍යාපාර අදහසක වැදගත්කම<br>  • ව්‍යාපාර අදහස් මූලාශ්‍ර | • ව්‍යාපාර අදහස් නිදසුන් සහිතව පැහැදිලි කරයි.<br>• ව්‍යවසායකයකුට හොඳ ව්‍යාපාර අදහසක වැදගත්කම හේතු සහිතව පැහැදිලි කරයි.<br>• ව්‍යාපාර අදහස් ජනිත කරගත හැකි මූලාශ්‍ර සඳහා නිදසුන් දක්වයි. | 05 |
| | 4.4 ව්‍යාපාර අවස්ථාවක යෝග්‍යතාව තක්සේරු කරයි. | • ව්‍යාපාර අදහස් ව්‍යාපාර අවස්ථාවක් බවට පත් කර ගැනීම<br>  • ව්‍යාපාර අවස්ථාව හැඳින්වීම<br>  • ව්‍යාපාර අදහස් හා අවස්ථා අතර වෙනස<br>  • හොඳ ව්‍යාපාර අවස්ථාවක ලක්ෂණ<br>  • හොඳ ව්‍යාපාර අවස්ථාවක් තෝරා ගැනීම<br>• තෝරාගත් ව්‍යාපාර අදහස සඳහා නීත්‍යානුකූල ආරක්ෂණය ලබා ගැනීම | • ව්‍යාපාර අදහස හා ව්‍යාපාර අවස්ථාව අතර වෙනස පැහැදිලි කරයි.<br>• හොඳ ව්‍යාපාර අවස්ථාවක් තක්සේරු කිරීම සඳහා භාවිත කළ හැකි නිර්ණායක දක්වයි.<br>• නව නිෂ්පාදිතයකට නීත්‍යානුකූල ආරක්ෂණය සලසා ගැනීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග පෙන්වා දෙයි. | 10 |
| | | | | 90 |

# ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය
# සඳහා උපදෙස්

**නිපුණතාව 1 :** ව්‍යවසායකත්වය හා එහි වැදගත්කම අවබෝධ කොට ගෙන ව්‍යවසායකයෙක් වීමේ ඇල්ම ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.1 :** ව්‍යවසායකත්ව සංකල්පය විග්‍රහ කරයි.

**කාලච්ඡේද ගණන :** 09

**ඉගෙනුම් ඵල :**


මෙම නිපුණතා මට්ටමට අදාළ පාඩම් අවසන් වීමෙන් පසු සිසුන්ට පහත සඳහන් ඉගෙනුම් ඵල අත්කර ගත හැකි ය.


- ව්‍යවසායකත්වය පිළිබඳ ස්වකීය අදහස ප්‍රකාශ කිරීමට.
- ව්‍යවසායකත්ව සංකල්පය හා බැඳුණු පහත සඳහන් මූලික පද ලිහිල් බසින් පැහැදිලි කිරීමට
  - නිර්මාණශීලිත්වය.
  - නවෝත්පාදනය.
  - අවදානම් බාර ගැනීම .
- සෙසු නිෂ්පාදන සම්පත්වලට සාපේක්ෂව ව්‍යවසායකත්වයෙහි සුවිශේෂත්වය සාකච්ඡා කිරීමට.

## පාඩම් සැලසුම සඳහා උපදෙස්

මෙම නිපුණතා මට්ටමට අදාළ ව විෂය නිර්දේශයේ ඇති විෂය අන්තර්ගතය ද, ඒ හා සම්බන්ධ ව පෙළපොතෙහි අඩංගු විෂය කරුණු පිළිබඳ ව ද, මනා වැටහීමක් ලබාගන්න. අනතුරුව පහත සඳහන් උපදෙස් කෙරේ අවධානය යොමු කරන්න.

- ව්‍යාවසායකත්වයේ විකාශනය ලුහඬින් පැහැදිලි කර, ව්‍යාවසායකත්වය පිළිබඳ විද්වතුන් ඉදිරිපත් කර ඇති මත කිහිපයක් ඉදිරිපත් කරන්න. එහිදී ව්‍යාවසායකත්වය පිළිබඳ නූතන අර්ථකථන ඉදිරිපත් කර ඒවා විග්‍රහ කරන්න.
- ඇමුණුම 1.1.1 හි සඳහන් ක්‍රියාකාරකමෙහි සිසුන් නිරත කරවන්න.
- මෙහි දී ඔබ හා සිසුන් දන්නා ව්‍යවසායකයකු නිදසුන් ලෙස ගෙන ඔවුන්ගේ නිෂ්පාදිතවල ස්වභාවය, ඔවුන්ගේ නව නිෂ්පාදිත , ව්‍යාපාරයේ ඇති වී ඇති දියුණුව පිළිබඳ ව දී ඇති විෂය නිර්දේශයේ අන්තර්ගත කරුණු මතු වන අයුරින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
- අවස්ථාවක් තිබේනම්, සාර්ථක ව්‍යවසායකයෙකු ගෙන්වා ඔහු මෙතෙක් ආ ගමන් මඟ පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කිරීමට ඉඩ සලස්වන්න.
- ව්‍යවසායකත්වය පිළිබඳ දී ඇති මත පැහැදිලි කිරීමේ දී එම මත සඳහා පදනම් වන කරුණු තහවුරු කරන්න.
- කුඩා ව්‍යාපාර වශයෙන් පවත්වා ගෙන යන ව්‍යවසායකයින් ද, කුඩා ව්‍යාපාර ලෙස ආරම්භ කර පසු ව විශාල ලෙස දියුණු වී ඇති ව්‍යවසායකයින් ද, අන්තර් ජාතික ලෙස ව්‍යාපාර කටයුතු කරන ව්‍යවසායකයින් ද සිටින බවත්, සඳහන් කර ඔවුන්ගේ නව නිපැයුම් අදාළ කර ගනිමින් සාකච්ඡාව පෝෂණය කරන්න.
- ව්‍යවසායකත්ව සංකල්පය හා බැඳුණු මූලික පද පිළිබඳ පාඩමේ දී ප්‍රවේශය සඳහා පහත සඳහන් තිත් නවය යා කිරීමේ ක්‍රියාකාරකම ඉදිරිපත් කරන්න.





- ඉහත තිත් 09 කඩදාසියක ලියා ගැනීමට සලස්වා එය සරල රේඛා හතරක් (04) ක් පමණක් උපයෝගී කරගෙන, කෙටිකාලයක් තුළ දී(විනාඩි 2 ක දී පමණ ) පෑන නොඔසවා යා කරන ලෙස සිසුන්ට දන්වන්න. එය සාර්ථක ව නිම කළ සිසුන්ගෙන් කෙනෙකු ඉදිරියට කැඳවා හුණු පුවරුවේ සඳහන් තිත් නවය යා කරන ආකාරය ආදර්ශනය කරන්න.

- නිර්මාණශීලී ව සිතීමෙන් ඉහත ක්‍රියාකාරකම නිවැරදි ව කළ හැකි බව පවසන්න. අනතුරුව ව්‍යවසායකත්වය හා **බැඳි මූලික සංකල්ප වන නිර්මාණශීලීත්වය, නවෝත්පාදනය හා අවදානම් භාර ගැනීම** යන සංකල්ප හඳුන්වා දෙන්න. එකිනෙක සංකල්ප අතර පවත්නා අන්තර් සම්බන්ධතාව පෙන්වා දෙන්න. නිර්මාණශීලීත්වය පිළිබඳ පැහැදිලි කිරීමේ දී නිර්මාණශීලීත්වයට බාධාකාරී වන සාධක පිළිබඳ ව ද, නිර්මාණශීලීත්වය වර්ධනය කරගත හැකි ආකාරය පිළිබඳ ව ද නිදසුන් ඉදිරිපත් කරන්න. නවෝත්පාදනය සඳහා අවශ්‍ය භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය යන සම්පත් තිබුණත් ව්‍යවසායකයින් දායක නොවී නිපැයුම් බිහි නොවන බව පෙන්වා දෙන්න. ඒ අනුව ව්‍යවසායකයින්ගේ වැදගත්කම තහවුරු කරන්න.

- නිපුණතා මට්ටම අවසානයේ දෙවරණ ස්වභාවයේ ප්‍රශ්න 10 ක් පමණ පිළියෙල කර සිසුන් ලවා අභ්‍යාස කරවන්න.

**නිදා:**

1. නිෂ්පාදන සම්පත් අතර වඩා වැදගත් සම්පත වන්නේ ව්‍යවසායකත්වයයි. (සත්‍යයි/අසත්‍යයි)
2. " ව්‍යවසායකත්වය" පුද්ගලයන් තුළ පවතින උසස් පෞරුෂ ගුණයකි. (සත්‍යයි/අසත්‍යයි)
3. ව්‍යවසායකත්වය පුද්ගලයන් තුළ වර්ධනය වී ඇත්තේ ඉතා මෑතකදී ය. (සත්‍යයි/අසත්‍යයි)

"A" ලැයිස්තුවේ වචනවලට ගැලපෙන යෙදුම් " **B** " ලැයිස්තුවෙන් තෝරා ඒවායේ අංක හිස්තැන මත ලියන්න.

| A | | B |
|---|---|---|
| | | 1. ගණකාධිකාරීවරයා |
| | | 2. යන්ත්‍රෝපකරණ හා මෙවලම් |
| | | 3. නවෝත්පාදන බිහිකිරීම |
| භූමිය | -------------- | 4. අමුද්‍රව්‍ය |
| ශ්‍රමය | -------------- | 5. වෙනසක් ඇති කිරීම |
| ප්‍රාග්ධනය | -------------- | 6. ජලය |
| ව්‍යාවසායකත්වය | -------------- | 7. මහා මාර්ග |
| | | 8. විදුහල්පති |
| | | 9. රථවාහන |
| | | 10. භාණ්ඩ/ සේවාවලට වටිනාකමක් ලබාදීම |

- ශ්‍රී ලංකා ව්‍යවසායකත්ව සම්මාන ලබාගත් ව්‍යවසායකයින් පිළිබඳ තොරතුරු රැස් කරවන්න

**මූලික වදන් /සංකල්ප**

- ව්‍යාවසායකත්වය.
- නිර්මාණශීලීත්වය.
- නවෝත්පාදනය.
- අවදානම් දැරීම.
- නිෂ්පාදන සම්පත්.

**ගුණාත්මක යෙදවුම්.**

- 10 ශ්‍රේණිය පෙළපොත. 1 පරිච්ඡේදය
- ඇමුණුම 1.1.1 හි ඇතුළත් ක්‍රියාකාරකම.

**තක්සේරුකරණ හා ඇගැයීම් නිර්ණායක :**

- නිර්මාණශීලිත්වය, නවෝත්පාදනය හා අවදානම් දැරීම යන මූලික පද ඇතුළත් ව ව්‍යවසායකත්වය සංකල්පය පැහැදිලි කරයි.
- ව්‍යවසායකත්ව සංකල්පය හා බැදි පහත සඳහන් මූලික පදවල අර්ථය සරළ ව පැහැදිලි කරයි.

  i නිර්මාණශීලිත්වය

  ii නවෝත්පාදන බව

  iii අවදානම් දැරීම

- භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය යන සම්පත්වලට වඩා ව්‍යවසායකත්ව සංකල්පය වෙනස්වන ආකාරයත් එම සම්පත් නිෂ්පාදනය සඳහා භාවිත කිරීමට ව්‍යවසායක්තවය අත්‍යවශ්‍ය බවත් තහවුරු කරයි.

බ්‍රිස්ටල්බෝඩ් හෝ ඩිමයි කොළයක පුද්ගලයකුගේ රූපයක් ඇඳ එහි පහත සඳහන් අවයව නම් කරන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| 1. ඇස | 2. මොළය | 3. කන | 4. නාසය | 5. බෙල්ල | 6. හදවත |
| 7. කට | 8. අත් | 9. අත් ඇඟිලි | 10. පාද | 11. පා ඇඟිලි | 12. කොඳු නාරටිය |

චිත්‍රය පන්තියට ඉදිරිපත් කර එම රූපයේ සඳහන් එකිනෙක අවයව පුද්ගලයකුට ප්‍රයෝජනවත් වන්නේ මන්දැයි සිසුන්ගෙන් විමසන්න. සිසු ප්‍රතිචාර හුණු පුවරුවේ සඳහන් කරන්න. අනතුරුව එම අවයව ව්‍යාවසායකයකු ප්‍රයෝජනයට ගන්නා ආකාරය පහත සඳහන් තොරතුරු පදනම් කරගෙන සාකච්ඡාවක් මෙහෙයවන්න. මෙහිදී වයාවසායකයා සාමාන්‍ය පුද්ගලයෙකුට වඩා සුවිශේෂී චරිතයක් බව තහවුරු කිරිම අවශ්‍ය වේ.

| | | | |
|---|---|---|---|
| 01. | ඇස | - | ව්‍යාපාර අවස්ථා ගවේෂණයට හා දැක්මක් ඇතිකර ගැනීම සඳහා. |
| 02. | මොලය | - | නිර්මාණාත්මක අදහස් ජනනය කිරිම සඳහා. |
| 03. | කන | - | දැනුම සහ පළපුරුද්ද ඇති අයගේ උපදෙස්වලට ඇහුම්කන් දීම සඳහා. |
| 04. | නාසය | - | පරිසරයේ ඇතිවන වෙනස්වීම් ආග්‍රහණය කිරීම සඳහා. |
| 05. | බෙල්ල | - | අවදානම් දරා ගැනීම සඳහා. |
| 06. | හදවත | - | කැපවීම, දැඩි උත්සහවන්තබව හා අරමුණු ඉටුවන විට ඇතිවන අභිමානය විඳදරා ගැනීම සඳහා |
| 07. | කට | - | ඵලදායී සන්නිවේදනයක් පවත්වා ගැනීම සඳහා. |
| 08. | අත් | - | සාර්ථකත්වයට උරදෙන කණ්ඩායම් සාමාජිකයින් වැළඳගැනීම සඳහා |
| .09. | අත් ඇඟිලි | - | අත්වැරදීම් /අසාර්ථකත්වයන්වලින් ලද ඉගෙනුම් අවස්ථා ගණනය කිරීම සඳහා. |
| 10. | පාද | - | ඇතිවන බාදා මගහැර යාම සඳහා. |
| 11. | පා ඇඟිලි | - | දුෂ්කර සහ අවදානම් මාර්ගවල ඇවිදයාම සඳහා. |
| 12. | කොඳු නාරටිය | - | ආත්ම විශ්වාසය ඇතිව ඉදිරියට යාම සඳහා . |

**නිපුණතාව 1.0 :** ව්‍යවසායකත්වය හා එහි වැදගත්කම අවබෝධ කොට ගෙන ව්‍යවසායකයෙකු වීමේ ඇල්ම ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.2 :** ව්‍යවසායකත්වය හා ව්‍යාපාර අතර අන්‍යෝන්‍යය සම්බන්ධතාව විමසයි.

**කාලච්ඡේද ගණන :** 06

**ඉගෙනුම් ඵල :**

මෙම නිපුණතා මට්ටමට අදාළ පාඩම් අවසන් වීමෙන් පසු සිසුන්ට පහත සඳහන් ඉගෙනුම් ඵල අත්කර ගත හැකි ය.

- ව්‍යාපාරවල ස්වභාවය සාකච්ඡා කිරීමට.
- ව්‍යවසායකයා හා ව්‍යාපාරිකයා අතර සමානකම් ඉදිරිපත් කිරීමට.
- ව්‍යපාරිකයා හා ව්‍යවසායකයා අතර වෙනස්කම් ඉදිරිපත් කිරීමට.
- ව්‍යවසායකයින් වර්ග නිදසුන් දක්වමින් පැහැදිලි කිරීමට.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව විෂය නිර්දේශයේ ඇති විෂය අන්තර්ගතය ද ඒ හා සම්බන්ධව පෙළපොතෙහි අඩංගු විෂය කරුණු පිළිබඳ ව ද මනා වැටහීමක් ලබා ගන්න. අනතුරුව පහත සඳහන් උපදෙස් කෙරේ අවධානය යොමු කරන්න.

- " ව්‍යාපාර යනු කුමක් දැයි " විමසමින් බුද්ධි කලම්භනයක් මගින් සිසු ප්‍රතිචාර ලබා ගන්න (විනාඩි 05 ක් ප්‍රමාණවත් ය).
- සිසු ප්‍රතිචාර සැලකිල්ලට ගනිමින් ව්‍යාපාර සංකල්පය හා ව්‍යාපාරවල ගති ලක්ෂණ පිළිබඳ හැඳින්වීමක් කරන්න.
- ව්‍යාපාරිකයා හා ව්‍යවසායකයා අතර වෙනස්කම් පැහැදිලි කිරීමේ දී ඇමුණුම 1.2.1 හි ඇතුළත් සම්මුඛ සාකච්ඡාව ප්‍රයෝජනයට ගන්න . මෙහි දී මාධ්‍යවේදියා, චරිත් හා විශ්ව යන චරිත 3 සඳහා සිසුන් තිදෙනෙකු තෝරා ගෙන භූමිකා රංගනයක් / සම්මුඛ සාකච්ඡාවක් ඇසුරින් එය පංතියට ඉදිරිපත් කළ හැකි ය. ඉන් අනතුරුව ව්‍යවසායකයා හා ව්‍යාපාරිකයා යන චරිත දෙකෙහි වෙනස්කම් හා සමානකම් අනාවරණය කරන්න.

- ව්‍යාපාර ව්‍යාවසායකයින් , සමාජයීය ව්‍යාවසායකයින් හා ආභ්‍යන්තරික ව්‍යාවසායකයින් සඳහා නිදසුන් දක්වන්න.
- සිසුන් දන්නා ව්‍යාපාරිකයකු හෝ ව්‍යාවසායකයකු පිළිබඳ පහත සඳහන් තොරතුරු රැස් කර ඉදිරිපත් කිරීමට උපදෙස් ලබා දෙන්න. එහි දී,
  - ව්‍යාවසායකයින්/ ව්‍යාපාරිකයින් 5 දෙනෙකු හඳුනා ගැනීම.
  - ඔවුන්ගේ ව්‍යාපාරවල නම් හා ඔවුන් ව්‍යාපාරිකයෙක් ද ව්‍යාවසායකයෙක් ද යන්න හේතු සහිත ව විනිශ්චය කිරීම. ඒ සඳහා පහත සඳහන් වගුව ප්‍රයෝජනයට ගන්න.

| ව්‍යාපාරයේ නම | අයිතිකරු ව්‍යවසායකයෙක්ද ව්‍යාපාරිකයෙක් ද | එසේ තීරණය කිරීමට හේතුව |
|---|---|---|
| 1<br>2<br>3<br>4<br>5 | | |

පහත වගුවේ සඳහන් ප්‍රකාශ සිසුන්ට ඉදිරිපත් කර ඒ ඒ ප්‍රකාශවල සඳහන් පුද්ගලයා ව්‍යාපාරිකයෙක්ද ? ව්‍යාවසායකයෙක්ද යන්න තීරණය කර ඒ ඒ ප්‍රකාශ ඉදිරියේ අදාළ ස්ථානයේ '' ✓'' ලකුණ යෙදීමට උපදෙස් දෙන්න. අනතුරුව ඒ ඒ පුද්ගලයා ව්‍යාවසායකයකු ලෙස සැලකීමට හෝ නොසැලකීමට හේතු සාකච්ඡා කරන්න.

| | | ව්‍යාපාරිකයා | ව්‍යාවසායකයා |
|---|---|---|---|
| 01. | නිමල් පරිසරයේ ඇති වන වෙනස්වීම්වලට ප්‍රතිචාර දක්වමින්, ප්‍රතිලාභ අත්කර ගනියි. | | |
| 02. | පබිලිස්ගේ ව්‍යාපාරය අදත් එදා පරිදි ම ය. | | |
| 03. | විපුලසේන විදුහල්පතිවරයා වැසීයාමට ආසන්න ව තිබූ පාසලක් ජනප්‍රිය පාසලක් බවට පත් කළේ ය. | | |
| 04. | බිල්ගේට්ස් පරිගණක ව්‍යාපාර ක්ෂේත්‍රයේ දැවැන්තයෙකි. | | |
| 05. | සුවඳ විලවුන් හා ආලේපන වර්ග සිල්ලර වෙළඳාමේ යෙදෙන විමලසේන, ස්වකීය භාණ්ඩ ගෙන්ගෙට ගොස් විකිණීමේ වැඩ පිළිවෙළකින් ඉතා සාර්ථක ප්‍රතිඵල ලැබූවෙකි. | | |
| 06. | මෝටර් රථ අමතර කොටස් විකුණන ජයසේන, ඔහුගේ ව්‍යාපාරය ආසන්නයේ ආරම්භ කිරීමට යන එවැනි ම ව්‍යාපාරයක් සඳහා නිතර බාධා කරයි. | | |
| 07. | ගත් ණය ගෙවා ගැනීමට නොහැකි ව, රූපසේන තම ව්‍යාපාරය වසා දැමී ය. | | |
| 08. | අකර්මන්‍ය ව පැවති රජයේ රෝහලක්, සැබෑ සුවසෙත සලසන රෝහල් පරිශ්‍රයක් බවට පරිවර්තනය කිරීමට එහි නව අධ්‍යක්ෂවරයා සමත් වී ඇත. | | |
| 09. | ජයසේන ඔහුට හිමි ත්‍රීරෝද රථ කිහිපයක් නගරයේ කුලියට දුවවයි. | | |
| 10. | රොඩ්රිගෝ ස්වකීය වගා කටයුතු සඳහා කාබනික පොහොර භාවිතයට මාරුවීමෙන් ඉහළ ප්‍රතිලාභ අත්කර ගනියි. | | |

**මූලික වදන්/සංකල්ප**

- අවශ්‍යතා හා වුවමනා
- ව්‍යාපාර
- ව්‍යාපාරිකයා හා ව්‍යාවසායකයා
- ව්‍යාපාර ව්‍යාවසායකයින්
- සමාජයීය ව්‍යාවසායකයින්
- අභ්‍යන්තරික ව්‍යාවසායකයින්

**ගුණාත්මක යෙදවුම්**

- 10 ශ්‍රේණියේ පෙළ පොත    පරිච්ඡේදය 2
- ඇමුණුම 1.2.1 ට අදාළ  මාධ්‍ය සාකච්ඡාවේ පිටපත් තුනක්.

**තක්සේරුකරණ හා ඇගයීම් නිර්ණායක :**

- ව්‍යාපාරවල ගති ලක්ෂණ ඇතුළත් වන පරිදි ව්‍යාපාර සංකල්පය පැහැදිලි කරයි.
- ව්‍යාපාරිකයා හා ව්‍යවසායකයා  අතර පවතින සමාන  ලක්ෂණ ඉදිරිපත් කරයි.
- ව්‍යවසායකයාත් ව්‍යාපාරිකයාත්  යන දෙදෙනාගේ  වෙනස්කම් සංසන්දනාත්මක ව දක්වයි.
- ව්‍යාපාර ව්‍යවසායකයින්, සමාජයීය ව්‍යවසායකයින් හා අභ්‍යන්තරික ව්‍යවසායකයින් සඳහා නිදසුන බැගින් දක්වයි.

ඇමුණුම 1.2.1

## මාධ්‍ය සාකච්ඡාව

පහත දක්වෙන්නේ '' Business '' රූපවාහිනී වැඩ සටහනේ මාධ්‍යාවේදියෙකු දනට ව්‍යාපාර කටයුතුවල යෙදෙන ප්‍රසිද්ධ පුද්ගලයින් දෙදෙනෙකු සමඟ කළ සම්මුඛ සාකච්ඡාවක තොරතුරු ය.

**මාධ්‍යවේදියා** : ඔබගේ ව්‍යාපාර කටයුතු ගැන කෙටියෙන් පැවසුවහොත්.

**චරිත්** : මගේ පියා කරගෙන ආ ව්‍යාපාරය මමත් කර ගෙන යනවා. මම ඒකෙන් සෑහීමකට පත් වෙනවා. මගේ පියා ඉස්සර ප්‍රදේශයේ ජනප්‍රිය ව්‍යාපාරිකයෙක්

**විශ්ව** : මේ ව්‍යාපාරය අපේ සීයගෙන් තාත්තට ආ එකක් . දෙදෙනා ම කළේ යකඩ හා වානේ උපකරණ හදන වැඩ පළක්. මම අද මුළුතැන්ගෙටයි ගොවිපලටයි ඕන කරන උපකරණ බොහොමයක් හදල වෙළෙඳපොළට සපයනවා.

**මාධ්‍යවේදියා** : දැන් මේ ප්‍රදේශයේ අලුත් ව්‍යාපාර බොහොමයක් ආරම්භ වෙලා නේද? ඒ ගැන ඔබ මොනවාද හිතන්නේ.

**චරිත්** : ඒක නම් ගැටලුවක් තමා. ඒත් මෙතනට ම පුරුදු වූ ගනුදෙනුකරුවෝ ඉන්නවානේ ඒ අය මගෙත් එක්ක ගනුදෙනු කරනවා.

**විශ්ව** : ඒක බොහොම හොඳ දෙයක්. මේ ප්‍රදේශයට එන ගනුදෙනුකරුවෝ වැඩි උනාම මගෙ ව්‍යාපාරයටත් ඒ අය එනවා. ඔවුන් ආකර්ෂණය කර ගැනීමට මම දැන ගන්න ඕන.

**මාධ්‍යවේදියා** : ඔබේ අනාගත සැලසුම් මොනවාද ?

**චරිත්** : ව්‍යාපාරය මේ විදියට ම කරගෙන යනවා. වැඩි වෙනස්කම් කරන්න ගියොත් මොනවා වෙයිද කියන්න බැහැනේ. මගෙන් පස්සෙ මගේ දරුවො මේ ව්‍යාපාරය දියුණු කරගෙන යාවි.

**විශ්ව** : මෙතනම රැඳෙන්න අදහසක් නැහැ. රටේ තොටේ සිදුවන දේ බලලා ව්‍යාපාරය ඒ අනුව දියුණු කර ගන්න වැඩ පිළිවෙළක් තියනවා.

**මාධ්‍යවේදියා** : ඉස්සර වගේ නෙවෙයි. අද පිටරටවල් සමඟ කරන ගනුදෙනු ඉහළ ගිහින්. ඒ ගැන ඔබ මොකද හිතන්නෙ.

**චරිත්** : පිටරට භාණ්ඩවල නම විතරයි. ඊට වැඩිය හොඳ දේවල් ලංකාවේ නිපදවනවා. පාරිභෝගිකයෝ මිල අඩු නම් ගන්නවා.

**විශ්ව** : ලෝකයේ මොනවද වෙන්නෙ කියලා දැනගෙන ඉන්න ඕන. පාරිභෝගිකයෝ අද බුද්ධිමත්. ඇගේ ගහල විකුණන්න බැහැ. ඔවුන්ට අවශ්‍ය දේ දෙන්න අපි දැන ගන්න ඕන.

**නිපුණතාව 1.0 :** ව්‍යවසායකත්වය හා එහි වැදගත්කම අවබෝධ කොට ගෙන ව්‍යවසායකයකු වීමේ ඇල්ම ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.3 :** ව්‍යවසායකයින්ගේ සුවිශේෂී ගති ලක්ෂණ විමර්ශනය කරයි.

**කාලච්ඡේද ගණන :** 09

**ඉගෙනුම්ඵල :**

මෙම නිපුණතා මට්ටමට අදාළ පාඩම් අවසන් වීමෙන් පසු , සිසුන්ට පහත සඳහන් ඉගෙනුම් ඵල අත්කර ගත හැකි ය.

- දෙන ලද ගති ලක්ෂණ අතුරින් ව්‍යවසායකයින්ට සුවිශේෂී වූ ගති ලක්ෂණ වෙන් කොට දැක්වීමට.
- ව්‍යවසායකත්ව ගති ලක්ෂණ ස්වකීය ගති ලක්ෂණ සමඟ ගලපමින් තමා තුළ පවත්නා ව්‍යවසායකත්ව ගති ලක්ෂණ ඉස්මතු කර දැක්වීමට.
- දෙන ලද ව්‍යවසායකත්ව ගති ලක්ෂණ විග්‍රහ කිරීමට.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව විෂය නිර්දේශයේ ඇති විෂය අන්තර්ගතය ද ඒ හා සම්බන්ධව පෙළපොතෙහි අඩංගු විෂය කරුණු පිළිබඳ ව ද මනා වැටහීමක් ලබා ගන්න. අනතුරුව පහත සඳහන් උපදෙස් කෙරෙහි අවධානය යොමු කරන්න.

- මෙම නිපුණතා මට්ටමට අදාළ ව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා ක්‍රීඩාවක් යෝජනා කෙරේ. එම ක්‍රීඩාවට හා පාඩමට පිවිසීම සඳහා පහත දැක්වෙන ''ජෝහාරි කවුළුව සංකල්පය'' පංතියට ඉදිරිපත් කරන්න.

- මේ සඳහා ශිෂ්‍යයෙකු පන්තිය ඉදිරියට කැඳවන්න. ඉන් පසුව එම ශිෂ්‍යයා පිළිබඳව තොරතුරු අනෙක් සිසුන්ගෙන් විමසන්න. ලැබෙන තොරතුරු අනුව ජෝහාරි කවුළුව සම්පූර්ණ කරන්න.


ජෝහාරි කවුළුව


| | තමා දන්නා | තමන් නොදන්නා |
|---|---|---|
| අන් අය දන්නා | විවෘත<br>Open | අන්ධ<br>Blind |
| අන් අය නොදන්නා | සැඟවුනු<br>Hidden | නොදන්නා<br>Unknown |

- " නොදන්නා" කොටස අඩු වීම වඩා වැදගත් බව තහවුරු කරන්න.
- එසේම තමන් තුළ ඇති ශක්තීන් සහ දුර්වලතා අනාවරණය කර ගැනීමේ වැදගත්කම ද පෙන්වා දෙන්න.
- පහත සඳහන් ක්‍රීඩාව සඳහා දී ඇති උපදෙස් මනාව අධ්‍යයනය කරන්න.
- ක්‍රීඩාව ගැන සමාලෝචනයක් කිරීම සඳහා එක ළඟ කාලච්ඡේද දෙකක් යොදා ගැනීම අවශ්‍ය වේ.
- ක්‍රීඩාව කිරීමෙන් පසු එක් එක් ව්‍යවසායකත්ව ගති ලක්ෂණය පැහැදිලි කරන්න.

- **ව්‍යවසායකත්ව ගති ලක්ෂණ අනාවරණය කර ගැනීමේ ක්‍රීඩාව සඳහා උපදෙස් :**

- පන්තිය කණ්ඩායම් දෙකකට හෝ වැඩි ගණනකට වෙන් කරන්න.
- කණ්ඩායම්වලට පුවත්පත් කඩදාසි තුන බැගින් ලබා දෙන්න.
- සුදුසු ස්ථානයක් තෝරා ගෙන පහත රූප සටහනේ පරිදි පෙට්ටියක් (සෙ. මී 30 පමණ දිග, සෙ.මී. 20 පමණක් පළල, සෙ.මී. 10 පමණ උස) තබා එතැන් සිට සමාන පරතරයකින් (පියවරක්, දෙකක් පමණ වන) 1, 2, 3, 4 5, 6, ආදී ලෙස මායිම් ලකුණු කරන්න.




- ලබා දුන් කඩදාසිවලින් ගුළි සකස් කර ගැනීමට උපදෙස් දෙන්න.
- කණ්ඩායමේ එක් එක් සාමාජිකයා සාදාගත් කඩදාසි ගුළි ලකුණු කරන ලද මායිම්වලින් කැමති ස්ථානයක සිට පෙට්ටිය තුළට පතිත වනසේ දමන ලෙසට උපදෙස් දෙන්න.
- සාර්ථක පතිත කිරීමක් සඳහා ක්‍රීඩා කළ ස්ථානයට හිමි අංකය ලකුණු ලෙස හිමි වේ.
- ක්‍රීඩාවට වට තුනකි. එක් සාමාජිකයෙකුට එක් වටයක දී අවස්ථා තුන බැගින් ලැබේ.
- පළමු වටයේ දී නිදහස් ව ක්‍රීඩා කිරීමට සලස්වන්න. දෙවන වටයේ දී ලකුණු ලබා ගැනීමට බාධා වන පරිදි අන් අයට උපක්‍රම යෙදීමට හැකි බව ද, තුන්වන වටයේ දී අසාර්ථක උත්සාහයන් සඳහා ක්‍රීඩා කළ ස්ථානයේ අදාළ ලකුණ අඩු කරන බව ද, එක් එක් තරඟ වාරය ආරම්භයේ දී දැනුම් දෙන්න.
- ගුරුවරයා පළමු ව ක්‍රීඩාව ආදර්ශනය කර පෙන්වන්න. අනතුරුව සෑම කණ්ඩායමකට ම පෙරහුරුවක් සඳහා අවස්ථාවක් ලබා දෙන්න.
- ක්‍රීඩාව කරන අතරතුර කණ්ඩායම් ලබා ගන්නා ලකුණු හුණු / සුදු පුවරුවක සටහන් කරන්න.
- දී ඇති ක්‍රීඩාව කරන අතරතුර ක්‍රීඩා කරන සිසුන්ගේ හැසිරීම් හොඳින් නිරීක්ෂණය කර, ඒවා මතක තබා ගෙන ක්‍රියාකාරකම සමාලෝචන අවස්ථාවේ එම නිරීක්ෂණ ව්‍යවසායකත්ව ගතිලක්ෂණ සමග සසඳමින් ඉදිරිපත් කරන්න.

- ලකුණු ලබා ගැනීමේ රටාව, සිසුන්ගේ හැසිරීම්, හා ක්‍රීඩා විලාශය විශ්ලේෂණය කිරීම මෙහි ඇති ඉතා වැදගත් කොටසක් වේ.
- ක්‍රීඩාව කරන අතරතුර, සිසුන්ට පෙනෙන සේ ලකුණු දීම සිදු කළ යුතු අතර ඒ සඳහා ක්‍රීඩාවට සහභාගි නොවන සිසුන් යොදාගත හැකි ය.
- ක්‍රීඩාව ඉතා තරඟකාරී අයුරින් පවත්වා ගෙන යාමට උත්සාහ කරන්න.
- ඒ ඒ කණ්ඩායම් හා කණ්ඩායම් තුළ සාමාජිකයන් ලබා ගන්නා ලකුණු සැලකිල්ලට ගෙන නිපුණතා මට්ටමට අදාළ අන්තර්ගත විෂය කරුණු මතු කර දක්වමින් ව්‍යාවසායකත්ව ගතිලක්‍ෂණ පැහැදිලි කරන්න.

- **නිපුණතා මට්ටමට අදාළ පාඩම් අවසන්වීමෙන් අනතුරුව,**

01. ඇමුණුම 1.3.1 හි ඇතුළත් ස්වයං ව්‍යාවසායකත්ව ගතිලක්‍ෂණ ඇගයීමේ ප්‍රශ්නාවලිය සිසුන්ට ලබා දී (ඡායා පිටපත්/ ලියා ගැනීමට සැලැස්වීම) මිනිත්තු 05 ක් පමණ කාලයක් තුළ පිළිතුරු ලබාගන්න. ප්‍රශ්නාවලියට පිළිතුරු සැපයීමේ දී ඉතාමත් අවංක වීමට ද නිවැරිදි පිළිතුරු " ඔව් " හෝ " නැත" විය හැකි බව ද පවසන්න.

02. ඇමුණුම 1.3.1 ඇතුළත් ඒ ඒ ප්‍රශ්නය මගින් මැනීමට අපේක්ෂා කරන ව්‍යාවසායකත්ව ගතිලක්ෂණ හා අපේක්ෂිත ප්‍රතිචාර පහත සඳහන් පරිදි වේ. ඇතැම් සිසුන් සතු ව එවැනි ගතිලක්ෂණ නොමැති නම් අධ්‍යාපනය, පුහුණුව හා අත්දැකීම් මගින් ඒවා දියුණු කරගත හැකි බව තහවුරු කරන්න.

03. ඇමුණුම 1.3.1 සඳහා විය හැකි පිළිතුරු හා ඒ අනුව හෙළිදරව් වන ව්‍යාවසායකත්ව ගති ලක්ෂණ පහත දැක්වේ.

| ප්‍රශ්න අංකය | විය යුතු පිළිතුර | | ව්‍යාවසායකත්ව ගතිලක්‍ෂණ |
|---|---|---|---|
| 1 | ඔව් | - | අඛණ්ඩ උත්සාහය |
| 2 | ඔව් | - | දරා ගැනීමේ ශක්තිය |
| 3 | නැත | - | ආත්ම විශ්වාසය |
| 4 | ඔව් | - | තොරතුරු සොයා බැලීම |
| 5 | ඔව් | - | නායකත්වය |
| 6 | ඔව් | - | සුභවාදීවීම |
| 7 | නැත | - | අභියෝග භාර ගැනීම |
| 8 | නැත | - | නවෝත්පාදන බව |
| 9 | නැත | - | අවදානම් භාර ගැනීම |
| 10 | ඔව් | - | නම්‍යශීලී බව |
| 11 | ඔව් | - | නිර්මාණශීලීත්වය |
| 12 | නැත | - | අසීරු අරමුණු ඉටුකර ගැනීමට ඇති නැඹුරුව |
| 13 | නැත | - | අභ්‍යන්තර පාලන පථය (තමා විසින් තමාව පාලනය කෙරෙන බව පිළිබඳ විස්වාසය) |
| 14 | ඔව් | - | පරිසර සංවේදී බව |
| 15 | ඔව් | - | දක්ම |

**මූලික වදන්/සංකල්ප**

- ව්‍යාවසායකයින්ගේ සුවිශේෂ ගතිලක්ෂණ.
- ව්‍යාවසායකයින්ගේ සාමාන්‍ය ගතිලක්ෂණ.

**ගුණාත්මක යෙදවුම්.**

- 10 ශ්‍රේණිය පෙළපොත. 1 පරිච්ඡේදය
- ඇමුණුම 1.3.1 හි ඇතුළත් ක්‍රීඩාවට අවශ්‍ය ද්‍රව්‍ය.

**තක්සේරුකරණ හා ඇගයම් නිර්ණායක :**

- සිසුන් තමන් තුළ තිබෙන ව්‍යවසායකත්ව ගතිලක්ෂණ ප්‍රකාශ කරයි.
- පුද්ගලයන්ගේ සාමාන්‍ය පෞරුෂ ගති ලක්ෂණ ද ව්‍යවසායකත්ව ගතිලක්ෂණ ද මිශ්‍ර ව දුන්විට ඒවායින් ව්‍යවසායකත්ව ගතිලක්ෂණ වෙන් කොට දක්වයි.
- දෙන ලද ව්‍යවසායකත්ව ගතිලක්ෂණවල තේරුම පැහැදිලි කරයි.

(ඇමුණුම 1.3.1)

| | ව්‍යවසායකත්ව ගතිලක්ෂණ ඇගයීමේ ප්‍රශ්නාවලිය | |
|---|---|---|
| 01. | කුමන බාධක පැමිණියද, මගේ අරමුණු ඉටු කර ගැනීම අත්නොහරිමි. | ඔව්/නැත |
| 02. | මට ඕනෑම දෙයක් දරා ගැනීමේ හැකියාව තිබේ . | ඔව්/නැත |
| 03. | මගේ දැඩි අපේක්ෂා ඉටු නොවූ කළ මම අධෛර්යට පත්වෙමි | ඔව්/නැත |
| 04. | යම් කාර්යයක් ආරම්භ කිරීමට පෙර මම ඒ පිළිබඳ ව බොහෝ තොරතුරු සොයා බලමි. | ඔව්/නැත |
| 05. | මගේ අදහස්වලට මට අන් අය එකඟ කරවා ගත හැකියි. | ඔව්/නැත |
| 06. | මා උත්සාහ කරන කටයුත්තක් සාර්ථක වේ යයි දැඩිසේ විශ්වාස කරමි. | ඔව්/නැත |
| 07. | අසීරු කාර්යයන් කිරීමට මම උත්සාහ නොකරමි . | ඔව්/නැත |
| 08. | ගැටලුවලට නව ආකාරයක විසඳුම් සොයනවාට වඩා පවතින විසඳුමකින් සෑහීමකට පත්වෙමි. | ඔව්/නැත |
| 09. | අලුත් දේ කිරීමට ගොස් අපහසුතාවට පත් වීමට වඩා පවතින දෙයක් කිරීම යහපත් යයි සිතමි. | ඔව්/නැත |
| 10. | අවශ්‍ය අවස්ථාවල දී මම මගේ තීරණ වෙනස් කර ගැනීමට පසුබට නොවෙමි. | ඔව්/නැත |
| 11. | බොහෝ අවස්ථාවල මම අලුත් දෙයක් කිරීමට කැමැත්ත දක්වමි. | ඔව්/නැත |
| 12. | සාර්ථක වේ යයි සිතන දේ පමණක් කිරීමට මම කැමැත්තක් දක්වමි. | ඔව්/නැත |
| 13. | මගේ බොහෝ කටයුතු සාර්ථක වන්නේ වාසනාව නිසා යයි මම විශ්වාස කරමි. | ඔව්/නැත |
| 14. | පරිසරයේ සිදුවන වෙනස්වීම් පිළිබඳව මම නිතර විමසිලිමත් වෙමි. | ඔව්/නැත |
| 15. | අනාගතයේ කවුරුන් විය හැකි දැයි පැහැදිලි ඉලක්කයක් මට තිබේ. | ඔව්/නැත |

**නිපුණතාව 1** : ව්‍යවසායකත්වය හා එහි වැදගත්කම අවබෝධ කොටගෙන ව්‍යවසායකයකුවීමේ ඇල්ම ප්‍රදර්ශනය කරයි.

**නිපුණතාව 1** : ව්‍යාවසායකත්වය හා එහි වැදගත්කම අවබෝධ කොටගෙන ව්‍යාවසායකයකුවීමේ ඇල්ම ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.4** : ව්‍යවසායකත්වයේ ප්‍රතිලාභ විමසයි.

**කාලච්ඡේද ගණන** : 06

**ඉගෙනුම් ඵල** :

මෙම නිපුණතා මට්ටමට අදාළ පාඩම් අවසන් වීමෙන් පසු සිසුන්ට පහත සඳහන් ඉගෙනුම් ඵල අත්කර ගත හැකි ය.

- කිසියම් පුද්ගලයෙකු ව්‍යවසායකයෙකු වීමෙන් ඔහුට අත්විදිය හැකි සුවිශේෂ ප්‍රතිලාභ සාකච්ඡා කිරීමට.
- ඇතැම් පුද්ගලයින් ජීවනෝපායක් ලෙස රැකියාවක් තෝරා ගැනීමට යොමු නොවී ව්‍යාපාර කිරීම සඳහා යොමු වීමට හේතු ඉදිරිපත් කිරීමට.
- දේශීය ආර්ථික සංවර්ධනය සඳහා ව්‍යවසායකයින් දායක වන අයුරු පෙන්වා දීමට.
- පුද්ගලයෙක් ව්‍යවසායකයෙක් වීමෙන් ලබන ප්‍රතිලාභ හා සේවා නියුක්තිකයෙක් වීමෙන් ලැබෙන ප්‍රතිලාභ සැසැඳීමට.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව විෂය නිර්දේශයේ ඇති විෂය අන්තර්ගතය ද ඒ හා සම්බන්ධව පෙළපොතෙහි අඩංගු විෂය කරුණු පිළිබඳ ව ද මනා වැටහීමක් ලබා ගන්න. අනතුරුව පහත සඳහන් උපදෙස් කෙරේ අවධානය යොමු කරන්න.

- මෙම නිපුණතා මට්ටම යටතේ ප්‍රථම පාඩමට පිවිසීමෙහි දී " **සිසුන් ඉගෙන ගැනීමෙන් අනතුරුව අනාගතයේ කවරෙකු වීමට අපේක්ෂා කරන්නේ දැයි** " විමසමින් බුද්ධි කලම්භනය කරන්න.
- අනතුරුව **රැකියා කිරීමට කැමැත්තක්** දක්වන සිසුන් එක් කණ්ඩායමකට ද **ස්වකීය කටයුත්තක යෙදීමට** කැමැත්තක් දක්වන සිසුන් තවත් කණ්ඩායමකට ද වෙන් කොට, එම තෝරා ගැනීමට හේතු ඒ ඒ කණ්ඩායම්වල සිසුන්ගෙන් විමසා කරුණු අනාවරණය කර ගන්න.
- ඇමුණුම 1.4.1 හි ඇතුළත් **සිසිරගේ ව්‍යාපාරය** පිළිබඳ සිද්ධිය සිසු කණ්ඩායම්වලට ලබා දී ගවේෂණයක යොදවන්න.
- ගවේෂණය සඳහා පහත සඳහන් මාතෘකා කණ්ඩායම්වලට ලබා දී තොරතුරු රැස් කරන්න.
    1. ව්‍යාපාරයෙන් සිසිරට ලැබෙන ප්‍රතිලාභ 2. ව්‍යාපාරයෙන් රටට ලැබෙන ප්‍රතිලාභ
- එම කරුණු ද අදාළ කර ගනිමින් ව්‍යවසායකත්වයෙන් ලැබෙන ප්‍රතිලාභ පිළිබඳ අවබෝධය ලබා දෙන්න.
- ව්‍යවසායකත්වයෙන් දේශීය ආර්ථිකයට ලැබෙන ප්‍රතිලාභ පිළිබඳ ව දැනුවත් කිරීමේ දී ප්‍රශ්නකරණය, දේශන හා සාකච්ඡා ක්‍රමය අනුගමනය කළ හැකි ය. එහි දී ව්‍යාවසායකයින් ව්‍යාපාර ආරම්භ කිරීම හා වැඩිදියුණු කර ගැනීම නිසා ලබන ප්‍රයෝජන පිළිබඳ ව සිසුන්ගෙන් විමසමින් හා ප්‍රශ්න කරමින් සාකච්ඡාවක් මෙහෙයවා අදාළ විෂය කරුණු මතු කර ගන්න. එහි දී නිදසුන් ඉදිරිපත් කිරීම ද අපේක්ෂා කෙරේ.

අදාළ වන ආකාරය සඳහන් කරන්න. මෙය කේවල හෝ කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස පැවරිය හැකිය.

| ප්‍රතිලාභ සඳහා සලකා බලන සාධක | සේවා නියුක්තිකයා | ව්‍යවසායකයා |
|---|---|---|
| • ඉපැයුම් පිළිබඳ අවදානම | | |
| • ආදායමේ හැසිරීම<br>• ස්වකීය තීරණ ක්‍රියාත්මක කිරීමේ හැකියාව<br>• අවශ්‍ය කෙරෙන අධ්‍යාපනය හා වෙනත් සුදුසුකම්<br>• නිදහස හා ස්වාධීන බව<br>• ස්වකීය විභවතා / හැකියාවලින් පළ ප්‍රයෝජන ගැනීම<br>• ස්වකීය ශ්‍රමය යෙදවිය හැකි කාලය (වයස් කාලය හා දිනක කාලය)<br>• නියැලී සිටින කටයුතුවල ඒකාකාරී බව හෝ විවිධත්වය<br>• සාපේක්ෂ වශයෙන් ජීවනතත්ත්වය /මට්ටම<br>• සමාජයීය පිළිගැනීම | | |

මෙම අභ්‍යාසය ඇගයීමකට ලක් කර ප්‍රතිපෝෂණ ලබා දෙන්න.

**මූලික වදන්/සංකල්ප**

- ව්‍යාවසායකත්වයෙන් පුද්ගලයන්ට ලැබෙන ප්‍රතිලාභ

**ගුණාත්මක යෙදවුම් .**

- 10 ශ්‍රේණිය පෙළපොත. 3 පරිච්ඡේදය
- ඇමුණුම 1.3.1 ට අදාළ ව ප්‍රමාණවත් පිටපත්.

**තක්සේරුකරණ හා ඇගැයීම් නිර්ණායක :**

- යම් අයෙක් ව්‍යාවසායකයෙක් වීමෙන් ඔහුට ම අත්වන ප්‍රතිලාභ 05 ක් ප්‍රකාශ කරයි.
- පුද්ගලයන් ව්‍යාපාර කිරීම සඳහා යොමුවන සාධක 05 ක් ප්‍රකාශ කරයි.
- ව්‍යවසායකත්වයෙන් ආර්ථිකයට අත්වන ප්‍රතිලාභ 06 ක් පැහැදිලි කරයි.
- පුද්ගලයෙක් රැකියාලාභියෙක් වීමෙන් හා ව්‍යාවසායකයෙක් වීමෙන් ලැබෙන ප්‍රතිලාභ සන්සන්දනය කරයි.



ඇමුණුම 1.4.1

## සිසිරගේ ව්‍යාපාරය

සිසරගේ වයස අවුරුදු 40 කි. ඔහු මාතර පදිංචිව සිටී. සිසිර මාතරට පැමිණෙන විට ඔහු සිටියේ තරුණ වියේ ය. ඔහුගේ පියා සේවය කළේ ආපන ශාලවක අරක්කැමියකු ලෙස ය. පාසලෙන් ඉවත් වීමෙන් පසු ඔහු කාර්මික ආයතනයකට ඇතුළත් ව, දෑ අවුරුදු ඇඳුම් මැසීමේ පාඨමාලාවක් හැදෑරී ය. පාඨමාලාව අවසන් කිරීමෙන් පසු මාතර ප්‍රදේශයේ පිහිටි අඳුම් මසන ආයතනයක සේවයට බැඳුනේ ය.

ඔහු එම ආයතනයේ අවුරුදු දෙකක් සේවය කොට අත්දැකීම් ලබා ගැනීමෙන් පසු තමාගේ ම ව්‍යාපාරයක් ආරම්භ කිරීමට තීරණය කළේ ය. ව්‍යාපාරය සඳහා වාණිජ බැංකුවකින් ණය මුදලක් ලබා ගෙන, ඔහුගේ ඉතුරුම්වලට අමතර ව එය ව්‍යාපාරයට යොදවන ලදී.

තම කටයුතුවලට පහසු වූ හෙයින් ඔහුගේ නිවස අසල පිහිටි වෙළෙඳ මධ්‍යස්ථානයක කාමරයක් සිසිර කුලියට ගත්තේ ය . ඔහු මහන මැෂින් හතරක් හා රෙදි මිල දී ගෙන, අනතුරුව ඇඳුම් කැපීම සහ මැසීම සඳහා දක්ෂ ඇඳුම් මසන්නන් හතර දෙනෙකු බඳවා ගන්නා ලදී. මූලික වශයෙන් ඔහු ගවුම්, කලිසම් සහ කමිස නිෂ්පාදනය කළේ ය. පාරිභෝගිකයින් හට පැමිණ මිලදී ගැනිම සඳහා ඔහු තම නිෂ්පාදන වෙළෙඳසලේ ප්‍රදර්ශනය කරන ලදී. පසුව නිල ඇඳුම් සැපයීම සඳහා ඇණවුම් සිසිර භාර ගන්නා ලදී. මෙම ඇණවුම් සම්පූර්ණ කර ගැනීම සඳහා ඔහුට දක්ෂ පූර්ණකාලීන සේවකයින් පස් දෙනෙකු සහ අර්ධකාලීන සේවකයින් දෙදෙනෙකු අවශ්‍ය විය. ඔහුට තවත් වැඩිපුර මහන මැෂින් තුනක් මිලදී ගැනීමට ද සිදු විය. සිසිරට එම ඇණවුම් සම්පූර්ණ කිරිමට හැකි වූ අතර, ඔහුගේ පාරිභෝගිකයන් නිෂ්පාදන පිළිබඳව සතුටට ද පත් විය. ඔහුගේ ව්‍යාපාරය පුළුල් විමත් සමග ම ඔහුට වැඩි ඉඩකඩ ප්‍රමාණයක් අවශ්‍ය වූ හෙයින් නගරයේ ප්‍රසිද්ධ ස්ථානයක පිහිටි විශාල ගොඩනැගිල්ලක් ඔහු මේ සඳහා මිල දී ගන්නා ලදී. ඔහු ආයතන දෙකක් සඳහා අඛණ්ඩ ව නිල ඇඳුම් සැපයූ අතර ම, වෙනත් පාරිභෝගිකයන් හට විකිණීම සඳහා ද ඇඳුම් නිර්මාණය කරන ලදී. මේ අවස්ථාවේ දී ඔහුට ව්‍යාපාරයේ මුදල් පරිහරණය හා ගනුදෙනු වාර්තාවල වැඩ කටයුතු කිරීම සඳහා ගිණුම් ලිපිකරුවෙක් සහ ඔහුගේ ව්‍යාපාරික කටයුතු සඳහා සහායකයෙකු සේවයට බඳවා ගැනීමට සිදු විය.

ඔහුගේ නිෂ්පාදන දේශිය පාරිභෝගිකයින් අතර සහ විදේශිය වෙළෙඳ පොළ පාරිභෝගිකයින් අතර ප්‍රසිද්ධ කිරීම සඳහා සිසිර විසින් කොළඹ ප්‍රදේශයේ ප්‍රදර්ශනයක් සංවිධානය කරන ලදී. මුල් ප්‍රදර්ශන දෙක අවසාන වීමත් සමගම අසල්වැසි එක් රටකට ඔහුගේ නිෂ්පාදන අපනයනය කිරීම සඳහා ඔහුට අවස්ථාව ලැබුණි.

සිසිර ඔහුගේ පාරිභෝගිකයින්හට හිතවත් ය. ඔහුගේ අවංකභාවය නිසා පාරිභෝගිකයින් ඔහුට ඇලුම් කරයි. ඔහුගේ සේවකයින් ද ඔහුට ඇලුම් කරන අතර, ඔවුහු පක්ෂපාතී ව සහ සේවයට කැප වී වැඩ කරති. ඔහුගේ සේවකයින්ගේ පස් දෙනෙක් වසර දහයකට වඩා මෙම ව්‍යාපාරයෙහි සේවය කර ඇත. ඔහුගේ සේවකයෝ සහ පාරිභෝගිකයෝ ඔහුව ''ෆැෂන්'' යන අන්වර්ථ නාමයෙන් අමතති. ඔහු එම නාමයට කැමති නිසා එය පිළිගෙන ඇත. සිසිර ඔහුගේ සේවකයින් හට හොඳ වැටුපක් ගෙවයි. ඔහු ඔවුන් වෙනුවෙන් රක්ෂණ ක්‍රමයක් ද සංවිධානය කර ඇත. ඔවුන්ගේ මාසික වැටුපට අමතර ව ගමන් වියදම් සඳහා දීමනාවක් ද ගෙවනු ලැබේ. ඔහුගේ සේවකයන් හට රැකියාවේ උසස්වීම් ලබා දීමට ද ඔහු කටයුතු කර ඇත.

**විශේෂ උපදෙස්**

- ව්‍යවසායකත්ව ප්‍රතිලාභ පිළිබඳව සිසුන් දැනුවත් කිරීම සඳහා සම්පත් දායකයන් ද යොදවා ගත හැකි ය. ඒ අනුව ඔවුන්ගේ දේශනයකට සවන් දීමට සලස්වා අදාළ විෂය කරුණු මතු කර ගැනීමේ ක්‍රියාකාරකමක යෙදවීමට ද හැකි ය.

**නිපුණතාව 2 :** කුඩා පරිමාණ ව්‍යාපාරයක ව්‍යවසායකයෙකු විසින් ඉටු කරන භූමිකා විමර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 2.1 :** ව්‍යවසායකත්වය හා කුඩා පරිමාණ ව්‍යාපාර අතර ඇති සබඳතාව අනාවරණය කරයි.

**කාලච්ඡේද ගණන** : 06

**ඉගෙනුම් ඵල** :

මෙම නිපුණතා මට්ටමට අදාළ පාඩම් අවසන් වීමෙන් පසු සිසුන්ට පහත සඳහන් ඉගෙනුම් ඵල අත්කර ගත හැකි ය.

- කුඩා පරිමාණ ව්‍යාපාරවල ගතිලක්ෂණ පැහැදිලි කිරීමට.
- ශ්‍රී ලංකාව වැනි ආර්ථිකයකට කුඩා පරිමාණ ව්‍යාපාර ප්‍රයෝජනවත් වන අන්දම පෙන්වා දීමට.
- කුඩා පරිමාණ ව්‍යාපාර අසාර්ථක වීමට තුඩු දෙන කරුණු පිටු දැකීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීමට.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව විෂය නිර්දේශයේ ඇති විෂය අන්තර්ගතය ද ඒ හා සම්බන්ධව පෙළපොතෙහි අඩංගු විෂය කරුණු පිළිබඳ ව ද මනා වැටහීමක් ලබා ගන්න. අනතුරුව පහත සඳහන් උපදෙස් කෙරෙහි අවධානය යොමු කරන්න.

- ප්‍රදේශයේ ඇති කුඩා ව්‍යාපාර ආයතන නිදසුන් ලෙස ඉදිරිපත් කොට ඒවායේ ඇති පොදු ලක්ෂණ මොනවා දැයි අසමින් බුද්ධි කලම්බනයක සිසුන් යොදවන්න.
- සිසු ප්‍රතිචාර සැලකිල්ලට ගෙන කුඩා ව්‍යාපාර හා ඒවායේ ලක්ෂණ මතු වනසේ සාකච්ඡාවක් මෙහෙයවන්න.
- කුඩා ව්‍යාපාර සම්බන්ධයෙන් ආයතන හෝ පුද්ගලයන් දැක්වූ නිර්වචන දෙකක් පංතියට ඉදිරිපත් කරන්න.
- ඉන් පසුව දේශන හා සාකච්ඡා ක්‍රමය භාවිත කරමින් අදාළ විෂය කරුණු පැහැදිලි කිරිමට කටයුතු කරන්න.
- හැකිනම් ප්‍රදේශයේ සාර්ථක ව පවතින ව්‍යාපාර ආයතනයක් වෙත නිරීක්ෂණ චාරිකාවක යෙදී පහත කරුණුවලට අදාළ තොරතුරු අනාවරණය කරන්න.
  - ව්‍යාපාරයේ ආරම්භක අවධිය හා ව්‍යාපාරයේ වර්තමාන තත්ත්වය.
  - එම ව්‍යාපාරයේ ගතිලක්ෂණ.
  - සිසුන් හඳුනා ගන්නා, ව්‍යාපාරයේ ශක්තීන් හා දුර්වලතා.
  - ව්‍යාපාරය තවදුරටත් වර්ධනය කර ගැනීම සඳහා සිසුන්ගේ යෝජනා.

- **නිපුණතා මට්ටමට අදාළ පාඩම් අවසානයේ දී සිසුන් පහත ක්‍රියාකාරකම්වල යොදවන්න.**
  - පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම්වලට බෙදන්න.
  - පහත දැක්වෙන මාතෘකා කුසපත් ඇදීමෙන් ඒ ඒ කණ්ඩායම්වලට පවරන්න.

    i ශ්‍රී ලංකාවට කුඩා පරිමාණ ව්‍යාපාරවල ඇති වැදගත්කම.

    ii කුඩා පරිමාණ ව්‍යාපාරවල ශක්තීන් හා සීමා.

    iii කුඩා පරිමාණ ව්‍යාපාර සාර්ථක කර ගැනීමට යෝජනා.

  - පහත දැක්වෙන කොන්දේසි යටතේ දැනුම මිනුම තරඟයක් පවත්වන්න.
    - ප්‍රථමයෙන් අංක i මාතෘකාව ලැබුණු කණ්ඩායමට ඔවුන් හඳුනාගත් එක් පිළිතුරක් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න (කාලය තත්පර 30 යි).
    - එම කණ්ඩායමෙන් ඉදිරිපත් වන අයෙක් මාතෘකාවට අදාළ පිළිතුරක් දුන්නේ නම් ලකුණු 10 ක් පිරිනමන්න.
    - නියමිත කාලය තුළ එම කණ්ඩායමෙන් පිළිතුරක් නොලැබේ නම් එම අවස්ථාව සෙසු කණ්ඩායමකට ලබා දෙන්න. එම කණ්ඩායමෙන් ලබා දෙන පිළිතුරක් සඳහා ලකුණු 05 ලබා දෙන්න.
    - සෙසු මාතෘකා සඳහා ද ඉහත පිළිවෙල අනුගමනය කරන්න.
    - මෙලෙස වරකට එක් පිළිතුර බැගින් ලබා ගනිමින් වට පහක් තරඟය පවත්වන්න.

- **ඉගෙන ගත් විෂය කරුණු තවදුරටත් තහවුරු කර ගැනීම සඳහා පහත සඳහන් ක්‍රියාකාරකම්වල සිසුන් යෙදවීමට යෝජනා කෙරේ.**

  "ලංකා මාතාව පෝෂණය කරන කුඩා ව්‍යාපාර " වැනි ආකර්ෂනීය මාතෘකාවක් ඔස්සේ
  - රචනාවක් නිර්මාණය කිරිමට හෝ
  - කථාවක් පැවැත්වීමට අවස්ථාව ලබා දෙන්න.
  - ව්‍යාපාරිකයන් වෙනුවෙන් පළ කරන හෝ පාසැල් සඟරාවකට ඉදිරිපත් කරන ලිපියක් නැතහොත්
  - පාසල් බිත්ති පුවත් පතට ලිපියක් සකස් කරවන්න.

මෙම නිපුණතා මට්ටමේ විෂය කරුණු ආවරණය කරමින් දෙවරණ වර්ගයේ ප්‍රශ්න 10 ක් පමණ ඇතුළත් ලැයිස්තුවක් පන්තියට ඉදිරිපත් කර ප්‍රතිචාර ලබා ගන්න.

**නිදසුන්**

- ඕනෑම ආර්ථිකයක වඩා වැදගත් ව්‍යාපාර අංශය වන්නේ කුඩා පරිමාණ ව්‍යාපාර වේ. (සත්‍යයයි/අසත්‍යයයි)
- කුඩා පරිමාණ ව්‍යාපාර හඳුන්වනු ලබන්නේ ආයෝජනය කර ඇති ප්‍රාග්ධන වටිනාකම පදනම් කර ගෙන ය. (සත්‍යයයි/අසත්‍යයයි)
- බොහෝ සාර්ථක ව්‍යවසායකයන්ගේ මූලාරම්භය කුඩා පරිමාණ ව්‍යාපාරයකි. (සත්‍යයයි/අසත්‍යයයි)
- වෙළෙඳපොළ අවකාශ කුඩා පරිමාණ ව්‍යාපාරිකයන්ට පිවිසීම සඳහා ඉඩ ප්‍රස්ථා උදාකරයි. (සත්‍යයයි/අසත්‍යයයි)
- නවෝත්පාදනවලින් වැඩි ප්‍රතිශතයක් බිහිවන්නේ කුඩා ව්‍යාපාර වලින් ය. (සත්‍යයයි/අසත්‍යයයි)

**මූලික වදන්/සංකල්ප**

- කුඩා පරිමාණ ව්‍යාපාර
- කුඩා පරිමාණ ව්‍යාපාරවලින් ලැබෙන ප්‍රතිලාභ
- කුඩා පරිමාණ ව්‍යාපාරවල දුර්වලතා
- කුඩා පරිමාණ ව්‍යාපාර පිළිබඳ නිර්වචන

**ගුණාත්මක යෙදවුම්**

- 10 ශ්‍රේණිය පෙළ පොත - 4 පරිච්ඡේදය

**තක්සේරුකරණ හා ඇගැයීම් නිර්ණායක**

- කුඩා පරිමාණ ව්‍යාපාරවල දැකිය හැකි ලක්ෂණ 06 ක් ප්‍රකාශ කරයි.
- කුඩා පරිමාණ ව්‍යාපාර මගින් ශ්‍රී ලංකාවට ලැබෙන ප්‍රතිලාභ 06 ක් දක්වයි.
- කුඩා පරිමාණ ව්‍යාපාර අසාර්ථක වීමට බලපාන හේතු 05 ක් සඳහන් කරයි.
- කුඩා පරිමාණ ව්‍යාපාර අසාර්ථක වීමට තුඩු දෙන කරුණු වළකා ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග යෝජනා කරයි.

**නිපුණතාව 2 :** කුඩා පරිමාණ ව්‍යාපාරයක ව්‍යවසායකයෙකු විසින් ඉටු කරන භූමිකා විමර්ශණය කරයි.

**නිපුණතා මට්ටම 2.2:** කුඩා පරිමාණ ව්‍යාපාරයක් තුළ ව්‍යවසායකයෙකු ඉටු කරන ප්‍රධාන භූමිකා අධ්‍යයනය කරයි.

**කාලච්ඡේද ගණන :** 05

**ඉගෙනුම් ඵල :**

මෙම නිපුණතා මට්ටමට අදාළ පාඩම් අවසන් වීමෙන් පසු සිසුන්ට පහත සඳහන් ඉගෙනුම් ඵල අත්කර ගත හැකි ය.

- ව්‍යවසායකයෙක් ස්වකීය ව්‍යාපාරය තුළ ඉටු කරන ප්‍රධාන භූමිකා පැහැදිලි කිරීමට.
- ව්‍යාපාරයක් තුළ ව්‍යවසායකයෙකුගේ දෙන ලද භූමිකාවක කාර්යයන් දැක්වීමට.
- ව්‍යවාසායකයෙකුගේ එක් එක් භූමිකා ව්‍යාපාර සාර්ථකත්වයට බලපාන අයුරු සාකච්ඡා කිරීමට.

**පාඩම් සැලසම සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව විෂය නිර්දේශයේ ඇති විෂය අන්තර්ගතය ද ඒ හා සම්බන්ධව පෙළපොතෙහි අඩංගු විෂය කරුණු පිළිබඳ ව ද මනා වැටහීමක් ලබා ගන්න. අනතුරුව පහත සඳහන් උපදෙස් කෙරෙහි අවධානය යොමු කරන්න.

- මෙම නිපුණතා මට්ටමේ ප්‍රථම පාඩමට පිවිසීම සඳහා සිංහයා, කාන්තාව හා දඩයක්කරු (Lion, Lady, Hunter) ක්‍රීඩාව යොදාගත හැකි ය. එක් එක් චරිතය මගින් විවිධ භූමිකා රඟ දක්වන බව ක්‍රීඩාව මගින් සිසුන්ට ඒත්තු ගැන්විය හැකි ය. (උපදෙස් සඳහා ඇමුණුම 2.2.1 බලන්න.)

- පහත සඳහන් ආකාරයේ ක්‍රියාකාරකමක් මගින් කළමනාකරණ හා නායකත්ව භූමිකාවට අයත් කාර්යයන් අනාවරණය කර ගැනීම සඳහා සිසුන් යොමු කළ හැකි ය.
  පන්තියේ සිසුන් කණ්ඩායම් දෙකකට බෙදා පහත මාතෘකා දෙක කණ්ඩායම් දෙකට ලබා දෙන්න.
  1. විදුහල්පතිතුමාගේ කළමනාකරණ භූමිකාව
  2. විදුහල්පතිතුමාගේ නායකත්ව භූමිකාව

- තම පාසලේ විදුහල්පතිතුමාගේ/තුමියගේ කාර්යයන් අධ්‍යයනය කොට කණ්ඩායමට ලැබුණු මාතෘකාවට අදාළ ව කාර්යයන් ලැයිස්තුගත කිරීමට කණ්ඩායමට උපදෙස් දෙන්න.

- සිසුන් අනාවරණය කර ගත් තොරතුරු, සමස්ත පන්තියට නිර්මාණාත්මක ව ඉදිරිපත් කිරීම සඳහා සිසුන් සූදානම් කරවන්න. කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව සිසුන්ගෙන් සංවර්ධනාත්මක අදහස් විමසන්න. සිසුන්ගෙන් අනාවරණය වූ තොරතුරු ද, අදාළ විෂය කරුණු ද සැලකිල්ලට ගෙන පාඩම පැහැදිලි කරන්න. නිපුණතා මට්ටමට අදාළ පාඩම්වලින් අනතුරුව පහත දැක්වෙන ක්‍රියාකාරකම්වල සිසුන් නිරත කරවන්න.

(1) පහත දැක්වෙන්නේ කුඩා පරිමාණ ව්‍යාපාරිකයෙකුගේ ව්‍යාපාරය තුළ සිදු වූ ක්‍රියාකාරකම් ලැයිස්තුවකි. ඒ ඒ කාර්යය ව්‍යවසායකයකුගේ කවර භූමිකාවට අයත් ද යන්න තීරණය කොට භූමිකාවට අදාළ තීරුවේ" ✓" ලකුණ යොදන්න.

| ව්‍යාපාරිකයාගේ කාර්යයන් | අයිතිකරු | කළමනාකරු | නායකයා |
|---|---|---|---|
| 1. සේවකයන් දෙදෙනෙකුට වැඩ බෙදා දීම. | | | |
| 2. නව කොටසක් ව්‍යාපාරයට එකතු කිරීම. | | | |
| 3. නිවාඩු නොලබා වැඩ කරන අයට දිරි දීමනාවක් දීම. | | | |
| 4. රු. 50000 ක මුදලක් ව්‍යාපාරයට යෙදවීම. | | | |
| 5. බාහිර ආයතන සමඟ සබඳතා ජාලයක් ගොඩනගා ගැනීම. | | | |
| 6. පාඩු ලබන ව්‍යාපාර අංශයක් වසා දැමීමට තීරණය කිරීම. | | | |
| 7. ප්‍රමාද වී පැමිණි සේවකයන්ට අවවාද කිරීම. | | | |
| 8. ව්‍යාපාරයේ විකුණුම් වැඩි කර ගැනීම සඳහා ප්‍රචාරණ වැඩසටහනක් දියත් කිරීම. | | | |
| 9. ව්‍යාපාරයේ ඉදිරි කටයුතු පිළිබඳ ව සේවකයන් දැනුවත් කිරීම. | | | |
| 10. සේවකයන්ට ආදර්ශයක් වන පරිදි ක්‍රියා කිරීම. | | | |
| 11. ද්‍රව්‍ය අපතේ යාම වැළැක්වීමට කටයුතු කිරීම. | | | |
| 12. ස්වකීය කාර්යයන්වල නිරත කරවීම සඳහා සේවකයන් මෙහෙයවීම. | | | |

(2) ශ්‍රී ලංකාවේ හඳුනාගත් හොඳ නායකයෙක් පිළිබඳ ව සාකච්ඡාවකට භාජනය කොට ඔහු /ඇය හොඳ නායකයෙක් ලෙස සැලකීමට හේතු අනාවරණය කර ගැනීමේ ක්‍රියාකාරකමක සිසුන් යෙදවීමට යෝජනා කෙරේ.

## මූලික වදන්/සංකල්ප

- ව්‍යාවසායකයාගේ ප්‍රධාන භූමිකා
- ව්‍යාවසායකයකුගේ ප්‍රධාන භූමිකාවලට අදාල කාර්යයන්

## ගුණාත්මක යෙදවුම්

- 10 ශ්‍රේණිය පෙළපොත - 4 පරිච්ඡේදය

## තක්සේරුකරණ හා ඇගයම් නිර්ණායක

- ව්‍යවසායකයෙක් කුඩා පරිමාණ ව්‍යාපාරයක ඉටු කරන ප්‍රධාන භූමිකා නම් කර එම භූමිකා අතර ඇති අන්‍යෝන්‍ය සම්බන්ධතාව පැහැදිලි කරයි.
- කුඩාපරිමාණ ව්‍යාපාරයක් තුළ ව්‍යවසායකයකුගේ දෙන ලද භූමිකාවක් පැහැදිලි කරයි.
- ව්‍යාපාරයක ව්‍යවසායකත්ව භූමිකා ව්‍යාපාරයේ සාර්ථකත්වයට තුඩු දෙන අන්දම පෙන්වා දෙයි.


ඇමුණුම 2.2.1

**භූමිකා රංගනය**

- චරිත
  1. සිංහයා
  2. දඩයක්කරු
  3. කාන්තාව

- චරිතවල ලක්ෂණ
  1. සිංහයා දඩයක්කරුට බයයි.
  2. දඩයක්කරු කාන්තාවට බයයි.
  3. කාන්තාව සිංහයාට බයයි.

- තීරක වශයෙන් ගුරුවරයා ක්‍රියා කරයි. ඔහු රංගනයේ සාර්ථක අසාර්ථක බව පිළිබඳ කරුණු රැස් කර විනිශ්චය කරයි.
- සිංහයා, කාන්තාව හා දඩයක්කරු අතර ඇති සම්බන්ධතාව ගලා යන ආකාරය පහත රූපසටහනේ දැක්වේ.




- ඉහත චරිත සඳහා සිසු කණ්ඩායම් දෙකක් තෝරා කණ්ඩායම් A හා B වශයෙන් නම් කරන්න.
- එම කණ්ඩායම් ඔවුන්ගේ චරිත නිරූපණ අභිනයෙන් දැක් විය යුතු බවට සිසුන්ට උපදෙස් දෙන්න. මෙහි දී ගුරුවරයාගේ සංඥාවෙන් පසු කණ්ඩායම්වල සියලුදෙනා ම චරිතය එකවර රඟ දැක්විය යුතු බව පැහැදිලි කරන්න.
- රඟ දැක්වීමට පෙර සෑම අවස්ථාවක දී ම සූදානම් වීම සඳහා සුළු කාලයක් ලබා දෙන්න.

**උපදෙස්** • සිංහයා ගොරවන හා රෞද්‍ර ස්වරූපය දැක්වීම, දඩයක්කරුට බය බව හා කාන්තාවට බිය නැති බව අභිනයෙන් දැක්වීම.

- දඩයක්කරු තුවක්කුව හෝ දුනු ඊතල මානන ආකාරය, කාන්තාවට බය බව හා සිංහයාට බිය නැති බව අභිනයෙන් දැක්වීම.
- කාන්තාව නාරි ලාලිත්‍යයෙන් සිටින ආකාරය, දඩයක්කරුට බිය නැති බව හා සිංහයාට බිය බව අභිනයෙන් දැක්වීම.
- ජයග්‍රාහී කණ්ඩායම් තේරීම
  - එක් කණ්ඩායමක් සිංහයා ලෙස අභිනයෙන් රඟ දක්වන විට අනෙක් කණ්ඩායම දඩයක්කරු ලෙස අභිරූපනයේ යෙදුනහොත් දඩයක්කරුගේ කණ්ඩායම ජයග්‍රහණය කරයි.
  - එක් කණ්ඩායමක් සිංහයා ලෙස අභිනයෙන් රඟ දක්වන විට අනෙක් කණ්ඩායම කාන්තාව ලෙස අභිරූපනයේ යෙදුනහොත් සිංහයාගේ කණ්ඩායම ජයග්‍රහණය කරයි.
  - එක් කණ්ඩායමක් කාන්තාව ලෙස අභිනයෙන් රඟ දක්වන විට අනෙක් කණ්ඩායම දඩයක්කරු ලෙස අභිරූපනයේ යෙදුනහොත් කාන්තාව ජයග්‍රහණය කරයි.

- සංඥා කිරීමෙන් අනතුරුව සාර්ථක චරිතය රඟ දැක්වූ කණ්ඩායමට ලකුණු පිරිනමන්න.
- යම් අවස්ථාවක කණ්ඩායම් දෙක ම එකම චරිතය නිරූපණය කළේ නම් ලකුණු ලබා නොදී සම තත්ත්වයේ සිටින බව දන්වන්න.
- වට තුනක් පමණ රංගනයේ යොදවන්න.

**නිපුණතාව 2 :** කුඩා පරිමාණ ව්‍යාපාරයක ව්‍යවසායකයකු විසින් ඉටු කරන භූමිකා විමර්ශනය කරයි

**නිපුණතා මට්ටම 2.3:** කුඩා පරිමාණ ව්‍යාපාරයක් සාර්ථකව පවත්වාගෙන යාම සඳහා ව්‍යවසායකයකු වර්ධනය කර ගත යුතු නායකත්වය හා කළමනාකාරිත්ව කුසලතා අනාවරණය කරයි.

**කාලච්ඡේද ගණන :** 05

**ඉගෙනුම් ඵල :**

මෙම නිපුණතා මට්ටමට අදාළ පාඩම් අවසන් වීමෙන් පසු සිසුන්ට පහත සඳහන් ඉගෙනුම් ඵල අත්කර ගත හැකි ය.

- නායකත්ව හා කළමනාකරණ භූමිකා මැනවින් ඉටු කිරිම සඳහා ව්‍යවසායකයෙකුට තිබිය යුතු මූලික කුසලතා දැක්වීමට.
- දෙන ලද නායකත්ව හා කළමනාකරණ කුසලතා ලුහුඬින් පැහැදිලි කිරීමට.
- නායකත්ව හා කළමනාකරණ කුසලතා කුඩා ව්‍යාපාරයක සාර්ථකත්වයට හේතුවන අන්දම පෙන්වා දීමට.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව විෂය නිර්දේශයේ ඇති විෂය අන්තර්ගතය ද ඒ හා සම්බන්ධව පෙළපොතෙහි අඩංගු විෂය කරුණු පිළිබඳව ද මනා වැටහීමක් ලබා ගන්න. අනතුරුව පහත සඳහන් උපදෙස් කෙරෙහි අවධානය යොමු කරන්න.

- පාඩමට ප්‍රවේශ වීමේ දී ''වටුකුරුළු රංචුව'' පිළිබඳ අතීත බෞද්ධ කථාව සිසුන්ට ඉදිරිපත් කර, නායකත්වයට ගරු නොකිරීම, සාමුහිකත්වය හා සමගිය නොමැතිවීම, නිසා වැද්දාගේ දැලට කොටු වී වටු කුරුළු රංචුවට විනාශය ගෙන දුන් ආකාරය පැහැදිලි කරන්න. එසේ නැතහොත් ඒ හා සම්බන්ධ ඔබ දන්නා සිද්ධියක් ඉදිරිපත් කරන්න.
- මෙම නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණු ඉදිරිපත් කිරීම සඳහා ඇමුණුම 2.3.1 දී ඇති ''වගුරෙන් එතෙර වීමේ ක්‍රීඩාව'' යෝජනා කෙරේ.
- ක්‍රීඩාව සඳහා දි ඇති උපදෙස් හොඳින් අධ්‍යයනය කරන්න.
- ක්‍රීඩාව සඳහා ආසන්න කාලඡේද දෙකක් යොදා ගන්න.
- ක්‍රීඩාව අතරතුර ඒ ඒ කණ්ඩායම්වල හැසිරීම් හා සිසුන්ගේ ගතිලක්ෂණ නිරීක්ෂණය කර එම තොරතුරු අදාළ කර ගෙන දී ඇති විෂය කරුණු විශ්ලේෂණය කරන්න.
- ඇමුණුම 2.3.2 හි ඇතුළත් සිසුන්ගේ නායකත්ව ගුණාංග තක්සේරු කරන පත්‍රිකාව එක් එක් සිසුවාට ලබා දී ඔවුන් ලබාගත් ලකුණු අනුව ඇගැයීමක් කරන්න. මේ සඳහා විනාඩි 05 ක පමණ කාලයක් සෑහේ.
- නායකත්ව හා කළමනාකරණ කුසලතා මතු කර ගත හැකි හා කාලච්ඡේද දෙකක පමණ කාලයක් තුළ කළ හැකි ඔබ හොඳින් දන්නා ක්‍රීඩාවක් භාවිත කිරීමට ද හැකි ය.

**මූලික වදන් /සංකල්ප**

- තාක්ෂණික කුසලතා
- සන්නිවේදන කුසලතා
- මානව කුසලතා
- සංකල්පනාත්මක කුසලතා
- කණ්ඩායමක් සමග කටයුතු කිරීමේ කුසලතා
- උපදේශන කුසලතා
- ආදර්ශමත්ව කටයුතු කිරීමේ කුසලතා
- කණ්ඩායම නියෝජනය කිරීමේ කුසලතා

**ගුණාත්මක යෙදවුම්**

- 10 ශ්‍රේණිය පෙළ පොත - 4 පරිච්ඡේදය
- ඇමුණුම 2.3.1 හි යෝජිත ක්‍රීඩාවට අවශ්‍ය ද්‍රව්‍ය.
- ඇමුණුම 2.3.2 හි ප්‍රමාණවත් පිටපත්


## තක්සේරුකරණ හා ඇගයීම් නිර්ණායක :

- කුඩා පරිමාණ ව්‍යාපාරයක් සාර්ථක ව පවත්වාගෙන යාම සඳහා ව්‍යාවසායකයකු සතු විය යුතු නායකත්ව හා කළමනාකරණ කුසලතා සඳහන් කරයි.
- දෙන ලද නායකත්ව හා කළමනාකරණ කුසලතාවල අර්ථය ලුහුඩින් පැහැදිලි කරයි.
- නායකත්ව හා කළමනාකරණ කුසලතා කුඩා ව්‍යාපාරයක සාර්ථකත්වය හේතු වන ආකාරය පෙන්වා දෙයි.

ඇමුණුම 2.3.1

**" වගුරෙන් එතෙර වීමේ " ක්‍රීඩාව සඳහා උපදෙස් :**

- තරගය සඳහා පන්ති කාමරයෙන් බැහැර පාසලේ/මිදුලේ /පිට්ටනියේ ස්ථානයක් තෝරා ගන්න. මීටර 8 ක පමණ දුර ප්‍රදේශයක් මඩ වගුරු සහිත ප්‍රදේශය යැයි උපකල්පනය කරන්න.
- පහත සඳහන් පරිදි කල්පිත මඩ වගුරේ A ,B ,C , ආදී වශයෙන් මං තීරු ලකුණු කරන්න.



- කණ්ඩායමේ සිටින සිසුන් ගණනට වඩා එකක් වැඩි වනසේ කණ්ඩායමට පා රඳවන ලබා දෙන්න. (12"X8" පමණ ප්‍රමාණයේ කාඩ්බෝඩ් කැබලි පා රඳවන සේ භාවිත කරන්න).
- එම පා රඳවන භාවිත කොට සිසු කණ්ඩායම්වලට මඩ වගුර තරණය කිරීමට ඇති බව පවසන්න.
- තරගය නිරීක්ෂණය කිරීම සඳහා කණ්ඩායමකින් එක් අයෙකු හෝ දෙදෙනෙකු පමණ තෝරා ගෙන ඔවුන් ප්‍රතිවිරුද්ධ කණ්ඩායම්වලට යොමු කරන්න.
- දී ඇති කොන්දේසිවලට අනුව තරගය සිදු වන බව නිරීක්ෂණය කිරීම ඔවුන්ගේ වගකීම බව පවසන්න.
- ඊතලවලින් දැක්වෙන දිශාවට, සිසු කණ්ඩායමේ සියලු ම දෙනා ආරම්භක ප්‍රදේශයේ සිට අවසාන ප්‍රදේශය දක්වා ගමන් කළ යුතු ය.
- මඩ වගුරෙන් එගොඩවීමේ දී පහත කොන්දේසි අනුගමනය කළ යුතු බවට උපදෙස් දෙන්න.
  - පා රඳවන මතින් පමණක් එගොඩ විය යුතු ය.
  - සෑමවිට ම කණ්ඩායමේ කිසියම් හෝ සාමාජිකයෙකුගේ ස්පර්ශයක් (අත/පය) පා රඳවන මත තිබිය යුතු ය.
  - ස්පර්ශයක් නොමැති පා රඳවන ඇතොත් ඒවා මඩේ ගිලී අතුරුදහන් වේ. (ඒ අනුව ස්පර්ශයක් නොමැති පා රඳවනයක් ඇති විට වහා ම එය නිරීක්ෂණකයින් විසින් ආපසු ගත යුතු ය).
  - එසේ පා රඳවන ආරක්ෂා කර ගැනීමට නොහැකි වුවහොත් වඩ වගුර තරණය කිරීම ඉතා ද දුෂ්කර වේ.
  - දී ඇති පා රඳවන පමණක් භාවිත කරමින් වගුර තරණය කළ යුතු ය.
  - ජයග්‍රහණය සඳහා කණ්ඩායමේ සියලු ම දෙනා මඩ වගුර තරණය කළ යුතු ය.
  - අවසානයට එගොඩ වන්නා ඉතිරි පා රඳවන ද රැගෙන යා යුතු ය.
  - නියමිත කාලය තුළ මඩ වගුරෙන් එතෙර විය යුතු ය.
- සිසුන් දෙතුන් දෙනෙකු සහභාගී කරවා ගෙන ක්‍රීඩාව ආදර්ශනය කර පෙන්වන්න.
- සෑම කණ්ඩායමකට ම සහභාගී වීමට සහ මඩ වගුර තරණය කිරීමට මිනිත්තු 20 ක පමණ කාලයක් ලබා දෙන්න.
- කණ්ඩායම් එකවර ක්‍රියාකාරකමෙහි යොදවන්න.

ඇමුණුම 2.3.2

## නායකත්ව ගුණාංග

පහත සඳහන් ප්‍රශ්නාවලියට " ඔව්" " නැත" පිළිතුරු ලබා ගනිමින් සිසුන්ගේ නායකත්ව කුසලතා තක්සේරු කරන්න.

01. මා ක්‍රියා කරන්නේ ඉතා දුර දැක්මක් ඇති ව නොව මධ්‍යස්ථ දුර දැක්මක් සහිතව ය. ...............
02. පුද්ගලයන්ගෙන් එල්ලවන බලපෑම් හා පීඩන දරා ගැනීමට මට හැකියාවක් තිබේ. ...............
03. මගේ ඉලක්ක සපුරා ගැනීම සඳහා නිරන්තර ව උපදෙස් පතමි. ...............
04. පවත්නා තත්වය වෙනසක් කිරීමට මම කැමැත්තක් දක්වමි. ...............
05. ගැටලුවක් ඇති විට ක්ෂණික පිළිතුරක් ලබා නොදී ගැටලුව හොඳින් වටහා ගැනීමට උත්සාහ ගනිමි. ...............
06. අරමුණු ළඟා කර ගැනීම සඳහා සුපුරුදු චර්යාවන් වෙනස් කර ගැනීමට මම කැමති ය. ................
07. පරාජයන් ඉදිරියේ අවස්ථාවෝචිත ව පසුබැමට මම සූදානම් ය. .................
08. ඉතා භාරදූර වගකීම් පැමිණ කළ ඒවා කණ්ඩායමේ සුදුසු සාමාජිකයන්ට පවරමි. ................
09. කටයුතු කිරීමේ දී මගේ උපරිම ශක්තිය පිළිබඳ ව විශ්වාස කරමි. ................
10. මම ජයග්‍රහණය පමණක් අගය කරන අතර පරාජයන් අසතුටෙන් ප්‍රතික්ෂේප කරමි. ................
11. මගේ සහෘදයන්ට ගැටලු හා තර්ජන පැමිණි විට ඒවා විසඳා ගැනීමට ඔවුන්ට උදව් කරමි. ................
12. අරමුණු ලඟා කර ගැනීමේ දී පෞද්ගලික උත්සාහයට වඩා සාමූහික උත්සාහය ගැන විශ්වාස කරමි. ................

| | |
|---|---|
| 1, 3, 9. 10, පිළිතුරු ''නැත'' සඳහා එක ලකුණ බැගින් ලකුණු | 05 |
| 2, 4, 5, 6, 7, 8, 11, 12 පිළිතුරු ''ඔව්'' සඳහා ලකුණ බැගින් ලකුණු | 07 |
| | 12 |

**නිපුණතාව 3 :** ව්‍යවසායකයෙකු ලෙස ව්‍යාපාර පරිසරය විශ්ලේෂණය කරයි.

**නිපුණතා මට්ටම 3.1 :** ව්‍යාපාර පරිසරය අධ්‍යයනය සඳහා ව්‍යාපාර පරිසර සාධක වෙන් වෙන් ව විමසයි.

**කාලච්ඡේද ගණන :** 02

**ඉගෙනුම් ඵල :**

මෙම නිපුණතා මට්ටමට අදාළ පාඩම් අවසන් වීමෙන් පසු සිසුන්ට පහත සඳහන් ඉගෙනුම් ඵල අත්කර ගත හැකි ය.

- ව්‍යාපාර පරිසරය පැහැදිලි කිරීමට.
- ව්‍යවසායකයකු වශයෙන් ව්‍යාපාර පරිසරය ගැන සැලකිලිමත්වීමේ වැදගත්කම සාකච්ඡා කිරීමට.
- ව්‍යාපාර පරිසරයේ උපකොටස් සහිත ව ව්‍යාපාර පරිසරය වර්ග කිරීමට.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව විෂය නිර්දේශයේ ඇති විෂය අන්තර්ගතය ද ඒ හා සම්බන්ධව පෙළපොතෙහි අඩංගු විෂය කරුණු පිළිබඳ ව ද මනා වැටහීමක් ලබා ගන්න. අනතුරුව පහත සඳහන් උපදෙස් කෙරේ අවධානය යොමු කරන්න.

- පාසල ආයතනයක් ලෙස නිදසුනකට ගෙන එහි මෙහෙයුම් කටයුතුවලට බලපෑම් ඇති කරන සාධක සිසුන්ගෙන් විමසා බුද්ධි කලම්බනයක යෙදෙන්න.
- සිසු ප්‍රතිචාර සැලකිල්ලට ගෙන ව්‍යාපාර පරිසරය පිළිබඳ පැහැදිලි කිරීමට ප්‍රවේශ විය හැකි ය.
- පරිසරයෙන් ඇති කරන බලපෑම් පිළිබඳ ව අවබෝධයක් ලබාදීම සඳහා " බැලුන් පිපිරවීම" ක්‍රීඩාවේ සිසුන් යෙදවිය හැකියි.
- එම ක්‍රීඩාව සඳහා උපදෙස්
  - සිසුන් කණ්ඩායම් දෙකකට වෙන් කරන්න.
  - සිසුන් සංඛ්‍යාවට අනුව වර්ණ දෙකකින් බැලුන් සපයා ගන්න.
  - සාමාන්‍ය ප්‍රමාණයට පුම්බන ලද බැලුනයක් බැගින් එක් එක් සිසුවාගේ අතක ගැට ගසා ගැනීමට සලස්වන්න.
  - ස්වකීය කණ්ඩායමේ බැලුන් ආරක්ෂා කරගෙන සෙසු කණ්ඩායමේ බැලුන පිපිරවීම සඳහා කිසියම් සංඥාවකින් පසු අවස්ථාව ලබා දෙන්න.
  - කිසියම් ඉඩකඩ සීමාවක් තුළ (නිදර්ශන : පන්ති කාමරය) ක්‍රීඩාවේ යොදවන්න. (සෙසු පන්තිවල කටයුතුවලට බාධා නොවීමට වගබලා ගන්න.)
  - ක්‍රීඩාවෙන් අනතුරුව පරිසරයෙන් ඇති කරන බලපෑම පිළිබඳ සාකච්ඡා කොට අවබෝධයක් ලබා දෙන්න.
  - පරිසරයේ ඇතිවන බලපෑම්වල ස්වභාවය හා ප්‍රමාණය අනුව සිසුන් ස්වකීය තීරණ හා උපායමාර්ග ක්‍රියාත්මක කළ ආකාරය ද දැනුවත් කරන්න.

- ඔබ පාසලේ සාමාන්‍ය දෛනික කටයුතු කෙරෙහි බලපෑම් ඇති කරන සාධක ඇතුළත් ලැයිස්තුවක් පිළියෙල කරවන්න.
- පාසලේ කටයුතු කෙරෙහි හිතකර හෝ අහිතකර ලෙස බලපෑම් ඇති කරන සිදුවීම් පිළිබඳ තොරතුරු විදුහල්පතිවරයාට ලැබෙන මාර්ග ඇතුළත් ලැයිස්තුවක් පිළියෙල කරවන්න.

**මූලික වදන් /සංකල්ප**

- ව්‍යාපාර පරිසරය
- අභ්‍යන්තර පරිසරය
- බාහිර පරිසරය

**ගුණාත්මක යෙදවුම්**

- 10 ශ්‍රේණිය පෙළපොත - 5 පරිච්ඡේදය
- යෝජිත ක්‍රීඩාව සඳහා ප්‍රමාණවත් බැලුන

**තක්සේරුකරණ හා ඇගයීම නිර්ණායක :**

- ව්‍යාපාර පරිසරය නිවැරදි ව හඳුන්වයි.
- ව්‍යාපාර පරිසරයේ වෙනස්වීම් හේතු කොටගෙන මතුවන ශක්තීන්, දුර්වලතා, අවස්ථා හා තර්ජන පැහැදිලි කරයි.
- ව්‍යාපාර පරිසරය අභ්‍යන්තර සහ බාහිර වශයෙන් වර්ග කොට එම පරිසරය සමන්විත වන කොටස් නම් කරයි.

**නිපුණතාව 3 :** ව්‍යවසායකයෙකු ලෙස ව්‍යාපාර පරිසරය විශ්ලේෂණය කරයි.
**නිපුණතා මට්ටම 3.2:** ව්‍යාපාර අභ්‍යන්තර පරිසර බලවේගවල ක්‍රියාකාරිත්වය විග්‍රහ කරයි.
**කාලච්ඡේද ගණන :** 06
**ඉගෙනුම් ඵල :**

මෙම නිපුණතා මට්ටමට අදාළ පාඩම් අවසන් වීමෙන් පසු සිසුන්ට පහත සඳහන් ඉගෙනුම් ඵල අත්කර ගත හැකි ය.

- ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසරය නිදසුන් සහිත ව පැහැදිලි කිරීමට.
- ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසරයේ හඳුනා ගන්නා ශක්තීන් ඇගයීමකට ලක් කිරීමට.
- ව්‍යාපාර අභ්‍යන්තර පරිසරයෙන් හඳුනා ගන්නා දුර්වලතාවලට පිළියම් යෝජනා කිරීමට.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව විෂය නිර්දේශයේ ඇති විෂය අන්තර්ගතය ද ඒ හා සම්බන්ධ ව පෙළපොතෙහි අඩංගු විෂය කරුණු පිළිබඳ ව ද මනා වැටහීමක් ලබා ගන්න. අනතුරුව පහත සඳහන් උපදෙස් කෙරෙහි අවධානය යොමු කරන්න.

- මෙම පාඩමට පිවිසීමක් වශයෙන් ඔබ පාසලේ අභ්‍යන්තර පරිසරය හා සම්බන්ධ බලවේග (සාධක) ලැයිස්තු ගත කරවන්න.
- පහත දැක්වෙන ව්‍යාපාර හා සම්බන්ධ ප්‍රකාශන කියවා, කොටුව තුළ ඇති නිවැරදි පිළිතුර තෝරා "✓" ලකුණ යෙදීමට සලස්වන්න.

| | ප්‍රකාශන | ශක්තියකි | දුර්වලතාවකි | කිව නොහැක |
|---|---|---|---|---|
| 01 | සේවකයින්ගේ වැඩට පැමිණීම අවිධිමත් ය. | | | |
| 02 | පාරිභෝගිකයන්ට පහසු තැනක ව්‍යාපාරය පිහිටුවා ඇත. | | | |
| 03 | ව්‍යාපාරයට භාණ්ඩ සපයන අයට ගෙවීම් කිරීම ප්‍රමාද වේ. | | | |
| 04 | ගනුදෙනුකරුවන් ව්‍යාපාරයට නැවත නැවත පැමිණේ. | | | |
| 05 | කළමනාකරු උපරිම මානව හිතවාදී ව කටයුතු කරයි. | | | |
| 06 | ගුණාත්මක භාණ්ඩ සාධාරණ මිලකට සැපයීමේ හැකියාව ලැබී ඇත. | | | |
| 07 | භාණ්ඩවල මිල ගණන් ඉහළ යාම නිසා ව්‍යාපාරයේ විකුණුම්වල අඩුවීමක් දක්නට ඇත. | | | |
| 08 | අයිතිකරු ලාභයට ම මුල් තැන දී ක්‍රියා කරයි. | | | |
| 09 | සේවකයන් ව්‍යාපාරයට ඇඩි ලැදිකමක් දක්වයි. | | | |
| 10 | අයිතිකරු ස්වකීය තීරණ වෙනස් කර නොගනී. | | | |

- ඇමුණුම 3.2.1 ඇතුළත් සමදරා ව්‍යාපාරයේ සිද්ධිය සිසුන් කණ්ඩායම් කර ලබා දී එය අධ්‍යයනය කිරීමට සලස්වා එම ව්‍යාපාරය හා බැඳි පාර්ශ්ව හා ඒ ඒ පාර්ශ්ව තුළ හඳුනා ගත හැකි ශක්තීන් හා දුර්වලතා අනාවරණය කර ගැනීමේ ක්‍රියාකාරකමක යොදවන්න. නැතහොත් මෙම ව්‍යාපාර සිද්ධිය කියවන විට දෙවරක්වත් සවන්දීමට සලස්වා ක්‍රියාකාරකමේ යෙදවීමට ද හැකි ය.

**මූලික වදන්/සංකල්ප**

- අභ්‍යන්තර පරිසර බලවේග
- ශක්තීන්, දුර්වලතා

**ගුණාත්මක යෙදවුම්**

- 10 ශ්‍රේණිය පෙළ පොත - 5 පරිච්ඡේදය
- ඇමුණුම 3.2.1 හි ප්‍රමාණවත් පිටපත්

**තක්සේරුකරණ හා ඇගයීම් නිර්ණායක :**

- සේවකයන්, අයිතිකරුවන් ආදී පාර්ශ්ව නිදසුන් වශයෙන් ඉදිරිපත් කර අභ්‍යන්තර පරිසරය පැහැදිලි කරයි.
- අභ්‍යන්තර පරිසරයේ බලවේග ආශ්‍රිත ශක්තීන් සඳහා නිදසුන් දක්වයි.
- අභ්‍යන්තර පරිසරයේ බලවේග ආශ්‍රිත දුර්වලතා ලැයිස්තු ගත කරයි.
- අභ්‍යන්තර පරිසරයේ දුර්වලතා පිටුදැකීම සඳහා සුදුසු යෝජනා ඉදිරිපත් කරයි.

---

**ඇමුණුම 3.2.1**

සමදරා ව්‍යාපාරය

**සමදරා** ව්‍යාපාරය නිවසකට අවශ්‍ය බොහෝ දේ මිලදී ගැනීමට හැකි, කොට්ටාව, රුක්මල්ගම පිහිටි සුවිශාල සිල්ලර වෙළෙඳ ව්‍යාපාරයකි. **සමදරා** යනු ව්‍යාපාරයේ වත්මන් අයිතිකරුගේ මව ය. කිසිදු දැන්වීමක සමදරා යන නම නැතත් සමදරා කඩේ යන නම අවට ප්‍රදේශවල ද ප්‍රසිද්ධ ය. අද ව්‍යාපාරයේ කළමනාකරු මෙන් සේවය කරන්නේ **සමදරා** විසින් ස්වකීය වෙළෙඳසලේ සේවයට යොදවා ගත් කමල් නම් කුඩා කොලුගැටයා ය. ඔහු ව්‍යාපාරයේ සෑම කාර්යයක් ම සොයා බලා කටයුතු කරන අතර, නුපුරුදු ගනුදෙනුකරුවෝ ඔහු ව්‍යාපාරයේ අයිතිකරු විය හැකි යයි අනුමාන කරති. පැරණි ගනුදෙනුකරුවන්ගේ දූ දරුවන්, මුණුබුරන් ආදීන් ද මෙම ව්‍යාපාරය සමඟ ගනුදෙනු කරනු පෙනේ. ඔවුන් වෙනත් වෙළෙඳසළකට ගොඩවන්නේ **සමදරා** වෙළෙඳසැළේ නොමැති දෙයක් මිලදී ගැනීමට යයි කීම අතිශයෝක්තියක් නොවේ. උසස් ම තත්ත්වයේ භාණ්ඩ සාධාරණ මිලකට සැපයීම එදා සිට ම මෙම ව්‍යාපාරයේ ගුණාංගයකි. මෙය අලුයම විවෘත කරන සහ බොහෝ රෑ බෝවී වසා දමන නිවාඩුවක් නොමැති ප්‍රදේශයේ ඇති එක ම වෙළෙඳසළයි. සේවකයන් ද ව්‍යාපාරයේ මෙම පැවැත්මට හුරු වී ඇති අතර එසේ හුරුවීමට අපහසු නවක සේවකයින් නොබෝ දිනකින් ම ඔවුන් විසින් ම ස්වකීය සේවය අවසන් කර ගනිති. මෙම ව්‍යාපාරයේ ප්ලාස්ටික් භාණ්ඩ විකුණන අංශය සඳහා කමල් විසින් හඳුන්වා දුන් 3 ක් රු. 200/- සංකල්පය නිසා එම භාණ්ඩවල අලෙවිය බෙහෙවින් වැඩි විය. එහෙත් පාරිභෝගික භාණ්ඩ වෙළෙඳ අංශය ස්වයං සේවා අංශයක් ලෙස පවත්වා ගෙන යාම, විශාල තොග මිලදී ගත් ගනුදෙනුකරුවන්ගේ භාණ්ඩ ඔවුන්ගේ නිවෙස්වලට ප්‍රවාහනය කර දීම හා දුරකථන මගින් ඇණවුම් ලබාගෙන ඒවා සැපයීම වැනි නවතාවන් හඳුන්වා දීමට අවශ්‍යතාව ඇතත් අයිතිකරු එවැනි දේවල්වලට වැඩි මනාපයක් නොදැක්වීම කමල්ගේ සිත් තැවුලට හේතුවක් වී ඇති බව ඔහුගේ කතා බහින් තේරුම් ගත හැකි ය. ව්‍යාපාරයේ දියුණුව තමන්ගේ ද දියුණුව යැයි ව්‍යාපාරය සම්බන්ධ සෑම දෙනා සිතති.

**නිපුණතාව 3 :** ව්‍යවසායකයෙකු ලෙස ව්‍යාපාර පරිසරය විශ්ලේෂණය කරයි.
**නිපුණතා මට්ටම 3.3:** ව්‍යාපාර බාහිර පරිසර බලවේගවල ක්‍රියාකාරිත්වය විග්‍රහ කරයි.
**කාලච්ඡේද ගණන :** 06
**ඉගෙනුම් ඵල :**

මෙම නිපුණතා මට්ටමට අදාළ පාඩම් අවසන් වීමෙන් පසු සිසුන්ට පහත සඳහන් ඉගෙනුම් ඵල අත්කර ගත හැකි ය.

- ව්‍යාපාරයක බාහිර පරිසරය නිදසුන් සහිත ව පැහැදිලි කිරීමට.
- ව්‍යාපාරයක බාහිර පරිසරයෙන් හඳුනා ගන්නා අවස්ථා ඇගයීමකට ලක් කිරීමට.
- ව්‍යාපාරයක බාහිර පරිසරයේ හඳුනා ගන්නා තර්ජනවලට පිළියම් යෝජනා කිරීමට.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව විෂය නිර්දේශයේ ඇති විෂය අන්තර්ගතය ද ඒ හා සම්බන්ධව පෙළපොතෙහි අඩංගු විෂය කරුණු පිළිබඳ ව ද මනා වැටහීමක් ලබා ගන්න. අනතුරුව පහත සඳහන් උපදෙස් කෙරෙහි අවධානය යොමු කරන්න.

- පාසල නිදසුන් වශයෙන් ගෙන පාසලේ අරමුණු ඉටුකර ගැනීම සඳහා කරනු ලබන මෙහෙයුම් කටයුතු මොනවා දැයි සිසුන්ගෙන් විමසා බුද්ධි කලම්භන අභ්‍යාසයක යෙදෙන්න. ඒ සඳහා විනාඩි 05 ක පමණ කාලයක් ප්‍රමාණවත් ය.

- පහත සඳහන් ක්‍රීඩාව මගින් අරමුණු ඉටුකර ගැනීමේ දී බාහිරින් බලපෑම් එල්ල වන ආකාරය පිළිබඳ ව අවබෝධයක් ලබා දිය හැකි ය. මේ සඳහා උපරිම වශයෙන් විනාඩි 10 ක් සෑහේ.

    - පන්ති කාමර තුළ විනාඩියක් තුළ දී ඉටු කර ගැනීමට අපේක්ෂා කරන කාර්යයක් සිසුන්ගෙන් විමසන්න.
    - එම කාර්යය ඉටුකර ගැනීමේ දී පරිසරයෙන් බාධා එල්ල විය හැකි බව දැනුවත් කොට තෝරා ගත් සිසුන් කිහිපදෙනෙකු එසේ බාධා කිරීම සඳහා සෙසු අයට නොදැනෙන සේ යොදවන්න.
    - ඉදිරිපත් වන සිසුන් නම් කරමින් ඔවුන්ගේ අරමුණු ඉටුකර ගැනීමට අවස්ථාව ලබා දෙන්න.
    - කිසියම් සංඥාවකින් පසු එකී අරමුණු ඉටුකර ගැනීමට යොමු කරවන්න.

- පාසල යම් යම් අරමුණු / ඉලක්ක ඉටුකර ගැනීම සඳහා එහි කටයුතු මෙහෙයවන ආයතනයක් බවත් සැලසුම් කර ඇති පරිදි ඉලක්ක ළඟා කර ගැනීමේ දී බාහිර බලපෑම් එල්ල වන බවත් පැහැදිලි කර, එම බලපෑම්වලට සුදුසු ප්‍රතිචාර දක්වමින් අරමුණු ළඟා කර ගැනීමට සිදුවන බවත් නිදසුන් ඇසුරින් පැහැදිලි කරමින් අපේක්ෂිත විෂය කරුණු ඉදිරිපත් කරන්න.
- දක්වා ඇති එක් එක් පරිසර බලවේග පිළිබඳ ව විෂය කරුණු ඉදිරිපත් කිරීමේ දී හැකි තරම් යෝග්‍ය නිදසුන් ගෙන හැර දක්වන්න.
- බාහිර පරිසර සාධකවල බලපෑම් නිසා ඇති වන තර්ජන හා අවස්ථා සඳහා නිදසුන් ගෙන හැර දක්වමින් සිසුන්ගෙන් ද එවැනි තර්ජන හා අවස්ථා ගැන විමසන්න.
- මෙම නිපුණතා මට්ටමට අදාළ පාඩම්වලින් අනතුරුව සිසුන් පහත සඳහන් ක්‍රියාකාරකමෙහි යොදවන්න.

(1) පහත සඳහන් වගුවේ දක්වා ඇති පරිසර බලවේගවල බලපෑම කවර පරිසර බලවේගයකට අදාළ වේදැයි තීරණය කොට ඊට අදාළ කොටුව තුළ " ✓" ලකුණ යෙදීමට උපදෙස් දෙන්න.

| පරිසර බලවේග / පරිසර බලවේගවල බලපෑම් | ආර්ථික පරිසර බලවේග | තාක්ෂණික පරිසර බලවේග | ජන පරිසර බලවේග | ස්වභාවික පරිසර බලවේග | දේශපාලන හා නෛතික පරිසර බලවේග | ගෝලීය පරිසරය බලවේග |
|---|---|---|---|---|---|---|
| ආනයනය කරන භාණ්ඩ සඳහා බදු අය කිරීම. | | | | | | |
| ජනගහනයේ ස්ත්‍රී, පුරුෂ සංයුතිය වෙනස්වීම. | | | | | | |
| යම් යම් භාණ්ඩ සඳහා ප්‍රමිති නියම කිරීම. | | | | | | |
| අන්තර්ජාතික ප්‍රමිති සහිත භාණ්ඩ පමණක් විදේශ රටවල් විසින් මිලදී ගැනීම. | | | | | | |
| ප්‍රධාන රටවල් දෙකක් අතර දරුණු යුධ උණුසුමක් පැන නැගීම. | | | | | | |
| සූර්ය තාප බලශක්තියෙන් ක්‍රියා කරන යන්ත්‍ර සූත්‍ර හඳුන්වාදීම. | | | | | | |
| ඉහළ අස්වනු සඳහා පැරණි ක්‍රම ශිල්ප අත්හදා බැලීම. | | | | | | |
| උතුරේ යුද්ධය නිසා ගම්බිම් අතහැර පැමිණි පිරිස් නැවත පදිංචියට යාම. | | | | | | |
| ඉගැන්වීම් හා ඉගෙනුම් මාධ්‍යයක් ලෙස ජංගම දුරකථන භාවිතයට ගැනීම. | | | | | | |

- ඉහත දක්වා ඇති පරිදි පරිසර බලපෑම් සහිත ලැයිස්තුවක් සිසුන් ලවා පිළියෙල කරවන්න. මෙය කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස පවරන්න. එක් කණ්ඩායමක් පිළියෙල කළ ලැයිස්තුව වෙනත් කණ්ඩායමකට යොමුකොට ලකුණු කරවන්න.

- ඔබ විසින් යම් යම් පරිසර බලවේගවල බලපෑම් වරකට එක බැගින් සඳහන් කරන්න. එම බලපෑම් අනුව ඇති විය හැකි තර්ජනයක් හෝ අවස්ථාවක් සඳහන් කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න. දෙන ලද නිවැරදි පිළිතුරු සඳහා ලකුණු 01බැගින් ලබා දෙන්න. එය තරගයක් ලෙස පැවැත්විය හැකි ය. මෙම තරගය කේවල හෝ කණ්ඩායම් වශයෙන් සිදු කළ හැකි ය.

**මූලික වදන් /සංකල්ප**

- බාහිර පරිසරයේ බලවේග
  අවස්ථා, තර්ජන

**ගුණාත්මක යෙදවුම්**

- 10 ශ්‍රේණිය පෙළපොත - 5 පරිච්ඡේදය

**තක්සේරුකරණ හා ඇගයීම් නිර්ණායක :**

- බාහිර පරිසර බලවේග නිදසුන් වශයෙන් දක්වයි.
- බාහිර පරිසරය විශ්ලේෂණය කරන විට දැකිය හැකි ව්‍යාපාර අවස්ථාවලින් ප්‍රමුඛත්වයක් දිය හැකි අවස්ථා හඳුනා ගනියි.
- බාහිර පරිසර බලවේගවලින් එල්ල විය හැකි තර්ජන ප්‍රකාශ කරයි.
- බාහිර පරිසර බලවේගවලින් එල්ල විය හැකි තර්ජනවලට පිළියම් යෝජනා කරයි.

**නිපුණතාව 3 :** ව්‍යාවසායකයකු ලෙස ව්‍යාපාර පරිසරය විශ්ලේෂණය කරයි.
**නිපුණතා මට්ටම 3.4 :** ව්‍යාවසායකයකු වශයෙන් ශ්‍රී ලංකාවේ ආර්ථිකය පිළිබඳ ව ගවේෂණය කරයි.
**කාලච්ඡේද ගණන :** 06
**ඉගෙනුම් ඵල :**

මෙම නිපුණතා මට්ටමට අදාළ පාඩම් අවසන් වීමෙන් පසු සිසුන්ට පහත සඳහන් ඉගෙනුම් ඵල අත්කර ගත හැකි ය.

- ශ්‍රී ලංකා ආර්ථිකයේ ප්‍රධාන ව්‍යාපාර අංශ නිදසුන් සහිත ව පැහැදිලි කිරීමට.
- ව්‍යාපාර සඳහා ප්‍රයෝජනයට ගත හැකි ශ්‍රී ලංකාවේ සුලබ සම්පත්වලට නිදසුන් දැක්වීමට.
- ව්‍යවසායකයකු වශයෙන් ව්‍යාපාර පරිසර ප්‍රවණතා පිළිබඳ ව සැලකිලිමත්වීමේ වැදගත්කම සාකච්ඡා කිරීමට.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව විෂය නිර්දේශයේ ඇති විෂය අන්තර්ගතය ද ඒ හා සම්බන්ධව පෙළපොතෙහි අඩංගු විෂය කරුණු පිළිබඳ ව ද මනා වැටහීමක් ලබා ගන්න. අනතුරුව පහත සඳහන් උපදෙස් කෙරෙහි අවධානය යොමු කරන්න.

- මෙම නිපුණතා මට්ටමට අදාළ ව ප්‍රථම පාඩමට ප්‍රවේශවීම සඳහා ශ්‍රී ලංකාවේ සුලබ සම්පත් මොනවා ද? යන ප්‍රශ්නය සිසුන්ට යොමු කොට පිළිතුරු ප්‍රකාශ කිරීමට සලස්වන්න. එම පිළිතුරු හුණු පුවරුවේ ලියන්න. මේ සඳහා විනාඩි 05 ක පමණ කාලයක් ගන්න. වැඩි ම පිළිතුරු දුන් සිසුන් උපස්ථම්භනය කරන්න.

- අනතුරුව ශ්‍රී ලංකාවේ ඓතිහාසික වටිනාකම හා ශ්‍රී ලංකාවේ සම්පත් පිළිබඳ ව කෙටි සාකච්ඡාවක් මෙහෙවන්න. එම සාකච්ඡාවෙන් පසු සිසුන් කණ්ඩායම් 03 කට කණ්ඩායම් කර ඇමුණුම 3.4. 1 හි සඳහන් සිතියම් ලබා දී පහත සඳහන් උපදෙස් මත සිසුන් ගවේෂණයක යොදවන්න. (එක් කණ්ඩායමකට එක් සිතියමකි.)

    - සිතියම්වල දක්නට ලැබෙන සම්පත් නම් කොට ලැයිස්තු ගත කරවන්න.
    - සිතියම්වල සඳහන් නොවන වෙනත් සම්පත් 10 ක් ලැයිස්තු ගත කරවන්න.
    - එම සම්පත් කිසියම් වර්ගීකරණයක් යටතේ වර්ග කිරීමට සලස්වන්න.
    - ඒ ඒ සම්පත් යොදා ගෙන දැනට කරන ව්‍යාපාර 10ක් හා දැනට නොමැති එහෙත් අනාගතයේ දී බිහිවිය හැකි ව්‍යාපාර 05 ක් ලිවීමට උපදෙස් දෙන්න.

නිපුණතා මට්ටමට අදාළ පාඩම්වලින් අනතුරුව පහත සඳහන් ක්‍රියාකාරකම ලබා දෙන්න.

1. ඔබ ප්‍රදේශයේ ඇති සම්පත් හඳුනාගෙන පහත සඳහන් ශීර්ෂ යටතේ ලැයිස්තු ගත කරවීම.
   i. භූමිය ආශ්‍රිත ස්වභාවික සම්පත්
   ii. මිනිසා විසින් නිර්මාණය කරන ලද සම්පත්

2. ඉහත ඒ ඒ සම්පත් ආශ්‍රිත ව දැනට බිහිවී **ඇති** කර්මාන්ත/ ව්‍යාපාර නම් කිරීම
3. දැනට බිහිවී නැති එහෙත් ඒ ඒ සම්පත් ඇසුරින් අනාගතයේ දී බිහිවිය හැකි ව්‍යාපාර ලැයිස්තු ගත කිරීමට යොමු කිරීම.

**මූලික වදන්/සංකල්ප**
- ප්‍රාථමික නිෂ්පාදන අංශය
- ද්විතීයික නිෂ්පාදන අංශය
- තෘතීයික නිෂ්පාදන අංශය


**ගුණාත්මක යෙදවුම්**
- 10 ශ්‍රේණියට පෙළපොත - 5 පරිච්ඡේදය
- ඇමුණුම 3.4.1 හි ඇති ශ්‍රී ලංකාවේ සිතියම්

**තක්සේරුකරණ ඇගැයීම් නිර්ණායක :**

- ප්‍රධාන ව්‍යාපාර අංශ නිදසුන් සහිත ව පැහැදිලි කරයි.
- ශ්‍රී ලංකාවේ සුලබ ව ඇති සම්පත් සඳහා නිදසුන් ඉදිරිපත් කරයි.
- පරිසර ප්‍රවණතා පිළිබඳ ව විමසිලිමත් වීමේ වැදගත්කම සාකච්ඡා කරයි.



Sri Lanka (Ceylon)
Bombay
Hyderabad
Bangalore
Madras
Colombo
Sri Lanka
Maldives
Male
INDIAN OCEAN
N
W
S
POINT PEDRO
KAYTS
JAFFNA
DELFT
ELEPHANT PASS
KILLINOCHCHI
MULLATIVU
TALAIMANNAR
MANNAR
VAVUNIYA
NILAVELI
TRINCOMALEE
WILPATTU NATIONAL PARK
ANURADHAPURA
MIHINTALE
MEDIRIGIRIYA
PUTTALAM
AUKANA
POLONNARUWA
MANAMPITIYA
PASSIKUDAH
DAMBULLA
KANDALAMA
BATTICALOA
CHILAW
KURUNEGALA
MATALE
KNUCKLES
MAHIYANGANA
KANDY
PERADENIYA
KEGALLA
AMPARA
NATIONAL PARK
COLOMBO
HATTON
HORTON PLAINS
ADAMS PEAK
RATNAPURA
PANADURA
KALUTARA
BERUWELA
BENTOTA
AMBALANGODA
HIKKADUWA
GALLE
UNAWATUNA
WELIGAMA
MATARA
TANGALLA
HAMBANTOTA
DENIYAYA
EMBILIPITIYA
TISSAMAHARAMA
KATARAGAMA
ARUGAMBAY
LAHUGALA
POTTUVIL
ELLA
WELLAWAYA
KUMANA BIRD SANCTUARY
E-mail: sales@heritage.lk
Web: www.heritage.lk


SRI LANKA
The Pearl of the Indian ocean
KANKESANTURAI
JAFFNA
TALAIMANNAR
MANNAR
TRINCOMALEE
PULMODDAI
ANURADHAPURA
WILPATTU
PUTTALAM
SIGIRIYA
POLONNARUWA
BATTICALOA
KURUNEGALA
CHILAW
MATALE
KANDY
GAL-OYA
NUWARA-ELIYA
NEGOMBO
KEGALLE
HATTON
DICKOYA
MONARAGALA
KATUNAYAKE
COLOMBO
MT. LAVINIA
BADULLA
BANDARAWELA
BALANGODA
KUMANA
KALUTARA
BERUWELA
BENTOTA
RATNAPURA
YALA
KATARAGAMA
AMBALANGODA
HIKKADUWA
GALLE
HAMBANTOTA
TANGALLE
MATARA



New- 14-6-4


Sri Lanka
Kankesanthurai
Point Pedro
Jaffna
Elephant Pass
Kilinochchi
Mullaitivu
Mankulam
Talaimannar
Mannar Island
Madhu Road Sanctuary
Giant's Tank Sanctuary
Kokilai
Nilaveli
Vavuniya
Trincomalee
Wilpattu National Park
Anuradhapura
Mihintale
Ritigala Strict Natural Reserve
Polonnaruwa
Habarana
Minneriya Giritale Sanctuary
Puttalam
Sigiriya
Kalkudah
Dambulla
Batticaloa
Chilaw
Kurunegala
Marawila
Pinnewala
Arugam Bay
Negombo
Peradeniya
Kandy
Victoria Randenigala Rantambe Sanctuary
Katunayaka
Hakgala Gardens
Gal Oya National Park
Kitulgala
Badulla
Colombo
Nuwara Eliya
Horton Plains
Potuvil
Peak Wilderness Sanctuary
Bandarawela
Mount Lavinia
Panadura
Horana
Ratnapura
Haputale
Yala National Park
Kumana Bird Sanctuary
Kalutara
Beruwala
Bentota
Sinharaja Rain Forest
Kataragama
Ambalangoda
Tissamaharama
Bundala Sanctuary
Hikkaduwa
Hambantota
Galle
Tangalle
Weligama
Matara

**නිපුණතාව 4** : යෝග්‍ය ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ පූර්ව සූදානම ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 4.1** : ව්‍යාපාරයක් ආරම්භ කිරීමට පෙර ගත යුතු වැදගත් තීරණ අනාවරණය කරයි.

**කාලච්ඡේද ගණන** : 04

**ඉගෙනුම් ඵල** :

මෙම නිපුණතා මට්ටමට අදාළ පාඩම් අවසන් වීමෙන් පසු සිසුන්ට පහත සඳහන් ඉගෙනුම් ඵල අත්කර ගත හැකි ය.

- ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අපේක්ෂා කරන පුද්ගලයකු ව්‍යාපාරය ආරම්භ කිරීමට
- පෙර ගත යුතු වැදගත් තීරණ සාකච්ඡා කිරීමට.
- ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ දී ගත යුතු තීරණවල ස්වභාවය අනාවරණය කිරීමට.
  පුද්ගලයකු ව්‍යාපාරයක් ආරම්භ කිරීමට පෙර ගත යුතු තීරණ, ප්‍රමුඛතාව අනුව තේරීමට.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව විෂය නිර්දේශයේ ඇති විෂය අන්තර්ගතය ද ඒ හා සම්බන්ධව පෙළපොතෙහි අඩංගු විෂය කරුණු පිළිබඳ ව ද මනා වැටහීමක් ලබා ගන්න. අනතුරුව පහත සඳහන් උපදෙස් කෙරේ අවධානය යොමු කරන්න.

- මෙම නිපුණතා මට්ටමට අනුව ප්‍රථම පාඩමට පිවිසීමේ දී පහත දී ඇති සංඛ්‍යාලේඛනය ඉදිරිපත් කර බුද්ධි කලම්බන අභ්‍යාසයක නිරත කරවන්න.

ආරම්භ කරන ව්‍යාපාරවල සාර්ථක හා අසාර්ථක වීම පිළිබඳව තොරතුරු

| | **පවත්වාගෙනයාම** | **වැසීයාම** |
|---|---|---|
| 1 වන වර්ෂය අවසානයේ | 85% | 15% |
| 2 වන වර්ෂය අවසානයේ | 65% | 35% |
| 3 වන වර්ෂය අවසානයේ | 60% | 40% |
| 4 වන වර්ෂය අවසානයේ | 55% | 45% |
| 5 වන වර්ෂය අවසානයේ | 45% | 55% |
| 6 වන වර්ෂය අවසානයේ | 38% | 62% |

(මූලාශ්‍රය: sam.tingleff.com)

- ඉහත ප්‍රස්තාරය හා සංඛ්‍යා තොරතුරු ඉදිරිපත් කර ආරම්භ කරන ව්‍යාපාරවලට මෙවැනි ඉරණමක් උදාවීමට බලපෑ හැකි හේතු සාකච්ඡා කරන්න.
- භාණ්ඩ හා සේවා සංකල්ප හා වෙළෙඳපොළ සංකල්ප ඉදිරිපත් කිරීමේ දී ඒ සඳහා නිදසුන් සපයන්න.

නිදර්ශන : විවිධ ප්‍රමාණයේ හා වර්ගයේ යුත් හිස පීරන පනා ඉදිරිපත් කොට ඒවායින් පුද්ගලයන්ගේ

- කවර අවශ්‍යතා වුවමනා සපුරලන්නේ ද යන්නත්, ඒ ඒ පනා සඳහා වන පාරිභෝගිකයන්
- කවුරුන් ද යන්නත් විමසිය හැකි ය.
- පන්තියේ සිසුන් ලවා (කේවල/කණ්ඩායම් වශයෙන්) භාණ්ඩ ද සේවා ද ඇතුළත් ලැයිස්තුවක් (අයිතම 10 ක් පමණ) පහත සඳහන් ආකෘතියට අනුව පිළියෙල කර තොරතුරු ලබා ගන්න.

| භාණ්ඩය හෝ සේවාව | ඉටු කරන අවශ්‍යතාව/වුවමනාව | පාරිභෝගිකයා/ වෙළෙඳපොළ |
|---|---|---|
| | | |

- 

අවශ්‍යතා හා වුවමනා අතර වෙනස්කම් ද, භාණ්ඩ හා සේවා අතර වෙනස්කම් ද අවශ්‍ය නම් නැවත මතක් කළ හැකි ය.

- 

තරගය, ඉපයීම, ප්‍රාග්ධනය සපයා ගැනීම, ව්‍යාපාර තනිව හෝ හවුල්ව ආරම්භ කිරීම ආදී සංකල්ප ද ප්‍රායෝගික නිදසුන් සපයමින් ඒවායේ අර්ථය තහවුරු කරන්න.
පහත සඳහන් ගවේෂණ ක්‍රියාකාරකමේ නිරත කරවීමෙන් මෙම නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණු අනාවරණය කර ගත හැකි ය. මේ සඳහා සිසුන් කණ්ඩායම් කර එම කණ්ඩායම අනාගතයේ ව්‍යාපාරයක් ආරම්භ කිරීමට සූදානම් වන්නේ යැයි උපකල්පනය කිරීමට සලස්වා පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා ක්‍රියාකරකම සැලසුම් කරන්න.
නිදෑ: 1 කණ්ඩායම - භාණ්ඩ 2 කණ්ඩායම - සේවාව

- ව්‍යාපාරය මගින් සැපයීමට අපේක්ෂිත භාණ්ඩ හෝ සේවාව කුමක් ද?
- එකී භාණ්ඩ හෝ සේවාව කවුරුන් සඳහා කවර අවශ්‍යතාවන් හා වුවමනාවන් සපුරාලීම සඳහා ද?
- එකී භාණ්ඩය හෝ සේවාව සඳහා දැනට සිටින තරගකරුවන් කවුරුන් ද?
- අපේක්ෂිත ව්‍යාපාර සඳහා අවශ්‍ය ප්‍රාග්ධනය / මුදල් සපයා ගන්නේ කෙසේ ද?
- එම ව්‍යාපාරය පිහිටුවන්නේ කොහේ ද?
- ඔබ ව්‍යාපාරයේ කටයුතුවල පූර්ණ වශයෙන් නියැලෙන්නේ ද?, ඒ කෙසේ ද?
  කණ්ඩායම්වල අනාවරණ ඉදිරිපත් කිරීමට සලස්වා එම තොරතුරු ද පදනම් කරගෙන විෂය කරුණු පිළිබඳ අවබෝධය ලබා දෙන්න. මේ සඳහා දේශන හා සාකච්ඡා ක්‍රමය, ප්‍රශ්නකරණ ක්‍රමය අනුගමනය කළ හැකි ය.

නිපුණතා මට්ටමට අදාළ පාඩම් නිමවීමෙන් අනතුරුව පහත සඳහන් ක්‍රියාකරකම්වල සිසුන් නිරත කරවන්න.

(1) පුද්ගලයෙකුට ස්වකීය ජීවන පැවැත්ම සඳහා පහත සඳහන් අවස්ථා දෙකෙන් එකක් තෝරා ගැනීමට සිදුවී ඇත. එම තෝරා ගැනීම හා සම්බන්ධ තීරණ හා පදනම් වන කරුණු අනාවරණය කර ගැනෙන ආකාරයේ අභ්‍යාසයක නිරත කරවන්න. නැතහොත් සිසුන් කණ්ඩායම් දෙකකට බෙදා සංවාදයක් ගොඩනගන්න.

(1) රැකියාවක් කිරීම (2) ව්‍යාපාරයක් ආරම්භ කිරීම

(2) ව්‍යාපාරයක් ආරම්භ කිරීම සඳහා ප්‍රාග්ධනය සපයා ගත හැකි පහත සඳහන් මාර්ගවල පවත්නා වාසි හා අවාසි ලිවීමට සලස්වන්න.

i. ස්වකීය වත්කමක් විකිණීම.
ii. නෑදෑයන් / හිතමිතුරන්ගෙන් ඉල්ලා ගැනීම
iii. බැංකු ණය ලබා ගැනීම
iv. උකස් ණය

**මූලික වදන් /සංකල්ප**

- ව්‍යාපාරයක් ආරම්භ කිරීමට පෙර ගතයුතු තීරණ.

**ගුණාත්මක යෙදවුම්**

- 10 ශ්‍රේණිය පෙළපොත - 6 පරිච්ඡේදය
- ප්‍රස්තාරයෙහි පිටපතක්

**තක්සේරුකරණ හා ඇගයීම් නිර්ණායක :**

- ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අපේක්ෂා කරන්නෙකු ඊට පෙර ගත යුතු වැදගත් තීරණ 5 ක් ප්‍රකාශ කරයි .
- ව්‍යාපාරයක් ආරම්භ කිරීමට පෙර ගත යුතු තීරණ පෙන්වා දෙයි.
- ව්‍යාපාරයක් ආරම්භ කිරීමට පෙර ගත යුතු තීරණ වැදගත්කම අනුව පෙළගස්වයි.
- ව්‍යාපාරයක් ආරම්භ කිරීම සඳහා ස්ථානයක් තෝරා ගැනීමේ දී සැලකිලිමත් විය යුතු සාධක පැහැදිලි කරයි.

**නිපුණතාව 4 :** යෝග්‍ය ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ පූර්ව සූදානම ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 4.2:** නව ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ දී වෙළෙඳපොළට පිවිසිය හැකි විකල්ප ක්‍රම හා උපාය මාර්ග විමසයි.

**කාලච්ඡේද ගණන :** 05

**ඉගෙනුම් ඵල :**

මෙම නිපුණතා මට්ටමට අදාළ පාඩම් අවසන් වීමෙන් පසු සිසුන්ට පහත සඳහන් ඉගෙනුම් ඵල අත්කර ගත හැකි ය.

- ව්‍යවසායකයකුට ව්‍යාපාරයක් ආරම්භ කිරීම සඳහා වෙළෙඳපොළට ප්‍රවේශ විය හැකි විකල්ප ආකාර දැක්වීමට.
- ව්‍යවසායකයකුට ව්‍යාපාරයක් ආරම්භ කිරීම සඳහා ප්‍රවේශ විය හැකි විකල්ප ආකාරවල පවත්නා වාසි හා අවාසි පෙන්වා දීමට.
- නව ව්‍යාපාරයක් ආරම්භ කිරීම සඳහා පිවිසීමේ දී ව්‍යවසායකයකුට අනුගමනය කළ හැකි උපාය මාර්ග පැහැදිලි කිරීමට.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව විෂය නිර්දේශයේ ඇති විෂය අන්තර්ගතය ද ඒ හා සම්බන්ධව පෙළපොතෙහි අඩංගු විෂය කරුණු පිළිබඳව ද මනා වැටහීමක් ලබා ගන්න. අනතුරුව පහත සඳහන් උපදෙස් කෙරෙහි අවධානය යොමු කරන්න.

- මෙම නිපුණතා මට්ටම යටතේ ප්‍රථම පාඩමට පිවිසීමේ දී මෙහි පහත සඳහන් වගුව ඉදිරිපත් කරන්න.
  භාණ්ඩයක් හෝ සේවාවක් නිදසුන් වශයෙන් ගෙන සිසු අදහස් විමසා ප්‍රශ්නකරණය ඔස්සේ සංවාදයක් ගොඩනගන්න. →

පවතින භාණ්ඩය / සේවාව →

| | |
|---|---|
| | |
| පවතින වෙළෙඳපොළ | නව වෙළෙඳපොළ |

නව භාණ්ඩය/ සේවාව    නව වෙළෙඳපොළ    පවතින වෙළෙඳපොළ

- සංවාදයෙන් අනතුරුව පන්තියේ සිසුන් කණ්ඩායම් 4 කට බෙදා පහත සඳහන් යෝජිත ක්‍රියාකාරකම සඳහා සිසුන්ට කාර්ය පවරන්න.

(1) පහත සඳහන් මාතෘකා කණ්ඩායම්වලට ලබා දෙන්න.

1. පවතින වෙළෙඳපොළකට පවත්නා භාණ්ඩයක් හෝ සේවාවක් ඉදිරිපත් කිරීම.
2. පවතින වෙළෙඳපොළකට නව භාණ්ඩයක් හෝ සේවාවක් ඉදිරිපත් කිරීම.
3. නව වෙළෙඳපොළකට නව භාණ්ඩයක් හෝ සේවාවක් ඉදිරිපත් කිරීම.
4. නව වෙළෙඳපොළකට පවත්නා භාණ්ඩයක් හෝ සේවාවක් ඉදිරිපත් කිරීම

- කණ්ඩායමට ලැබුණ මාතෘකාව පැහැදිලි කර ගැනීම සඳහා සාකච්ඡාවක් පැවැත්වීමට උපදෙස් ලබා දී එම මාතෘකාවට අදාළ ව පහත සඳහන් තොරතුරු ඉදිරිපත් කිරීමට සලස්වන්න.
  - ඔබගේ වෙළෙඳපොළ කුමක් ද? එහි පාරිභෝගිකයන් කවු ද?
  - ඔවුන්ගේ ගතිලක්ෂණ (වයස, ස්ත්‍රී පුරුෂ බව, මිලදී ගැනීමේ රටාව) කවරේ ද?
  - ඔවුන් සඳහා ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරන භාණ්ඩය හෝ සේවාව කුමක් ද?
  - එම භාණ්ඩය හෝ සේවාව මගින් අපේක්ෂිත පාරිභෝගිකයින්ගේ කවර අවශ්‍යතාව හා වුවමනාව සපුරාලන්නේ ද?

- සිසුන්ගේ අනාවරණ ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දී එම අනාවරණ සැලකිල්ලට ගෙන දී ඇති විෂය කරුණු පැහැදිලි කරන්න.

- නව ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ දී ව්‍යවසායකයකුට වෙළෙඳපොළකට ප්‍රවිෂ්ට විය හැකි පහත සඳහන් විකල්ප ක්‍රමවල පවත්නා වාසි හා අවාසි ලියා දක්වන්න.
  i පවත්නා වෙළෙඳපොළකට පවත්නා භාණ්ඩයක් හෝ සේවාවක් ඉදිරිපත් කිරීම.
  ii. පවත්නා වෙළෙඳපොළකට නව භාණ්ඩයක් හෝ සේවාවක් ඉදිරිපත් කිරීම.
  iii. නව වෙළෙඳපොළකට නව භාණ්ඩයක් හෝ සේවාවක් ඉදිරිපත් කිරීම.
  iv. නව වෙළෙඳපොළකට පවත්නා භාණ්ඩයක් හෝ සේවාවන් ඉදිරිපත් කිරීම

- ඉහත සඳහන් එක් එක් අවස්ථාව සඳහා එක් නිදසුනක් බැගින් ඉදිරිපත් කිරීමට සිසුන් උනන්දු කරන්න. මෙය කේවල හෝ කණ්ඩායම් පැවරුමක් වශයෙන් ද ලබා දිය හැකි ය.

**මූලික වදන් /සංකල්ප**

- වෙළඳ පොළකට පිවිසිය හැකි විකල්ප ක්‍රම
- නව වෙළඳපොළ හා පවතින වෙළඳපොළ

**ගුණාත්මක යෙදවුම්**

- 10 ශ්‍රේණිය පෙළපොත - 6 පරිච්ඡේදය

**තක්සේරුකරණ හා ඇගයීම නිර්ණායක :**

- ව්‍යාපාරයක් ආරම්භ කරන විට වෙළෙඳපොළකට පිවිසිය හැකි විකල්ප ක්‍රම දක්වයි.
- වෙළෙඳපොළකට පිවිසිය හැකි විකල්ප ක්‍රමවල පවත්නා වාසි හා අවාසි පෙන්වා දෙයි.
- ව්‍යාපාරයක් ආරම්භ කරන විට අනුගමනය කළ හැකි සුදුසු උපාය මාර්ගය හේතු සහිත ව පැහැදිලි කරයි.

**නිපුණතාව 4 :** යෝග්‍ය ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ පූර්ව සූදානම ප්‍රදර්ශනය කරයි.
**නිපුණතා මට්ටම 4.3:** ව්‍යාපාරයක් සඳහා ව්‍යාපාර අදහසක් තෝරයි.
**කාලච්ඡේද ගණන :** 05
**ඉගෙනුම් ඵල :**

මෙම නිපුණතා මට්ටමට අදාළ පාඩම් අවසන් වීමෙන් පසු සිසුන්ට පහත සඳහන් ඉගෙනුම් ඵල අත්කරගත හැකි ය.

- ව්‍යාපාර අදහස් නිදසුන් සහිත ව පැහැදිලි කිරීමට.
- ව්‍යාපාරයකට හොඳ ව්‍යාපාර අදහසක වැදගත්කම හේතු සහිත ව පැහැදිලි කිරීමට.
- ව්‍යාපාර අදහස් ජනිත කර ගත හැකි මූලාශ්‍ර සඳහා නිදසුන් දක්වීමට.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව විෂය නිර්දේශයේ ඇති විෂය අන්තර්ගතය ද ඒ හා සම්බන්ධව පෙළපොතෙහි අඩංගු විෂය කරුණු පිළිබඳ ව ද මනා වැටහීමක් ලබා ගන්න. අනතුරුව පහත සඳහන් උපදෙස් කෙරෙහි අවධානය යොමු කරන්න.

- පරිසරයේ ඇතිවන වෙනස්වීම් සැලකිල්ලට ගෙන නව ව්‍යාපාරයක් ආරම්භ කිරීම සඳහා යෝග්‍ය නිර්මාණශීලී අදහස් ඉදිරිපත්කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දී බුද්ධි කලම්බන අභ්‍යාසයක යෙදෙන්න. ඉදිරිපත් කරන සෑම අදහසක් ම පිළිගන්න. ඒවා හුණු පුවරුවෙහි සඳහන් කරන්න.
- බුද්ධි කලම්බනය කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස ද සිදු කළ හැකියි. එහිදී සිසුන් කණ්ඩායම් කර, ව්‍යාපාර අදහස් ජනනය කිරීමට කණ්ඩායමට පවරන්න. තෝරාගත් නායකයකු මගින් කණ්ඩායමේ ව්‍යාපාර අදහස් සමස්ත පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න. අනතුරුව සිසුන් පහත සඳහන් කණ්ඩායම් ක්‍රියාකාරකමේ යොදවන්න.

- මේ සඳහා විනාඩි 20 ක් පමණ සෑහේ.

**I. කණ්ඩායම**

- තමන් වඩාත් ඇලුම්කරන දේවල්/ විනෝදාංශ 5 ක් සඳහන් කරන්න.
- එම ඇලුම් කරන දේවල් /විනෝදාංශ ඇසුරින් ව්‍යාපාර අදහස් 5 ක් ජනනය කරවන්න.
- කණ්ඩායම සාකච්ඡා කොට නව ව්‍යාපාරයක් සඳහා සුදුසු එක් ව්‍යාපාර අදහසක් තෝරා පන්තියට ඉදිරිපත් කරවන්න.
- තෝරාගත් ව්‍යාපාර අදහස එසේ තේරීමට හේතු ලබා ගන්න.

**II. කණ්ඩායම**

- ප්‍රචාරණ දැන්වීම් ඇතුළත් පත්තර පිටුවක් ලබා දෙන්න.
- එම ප්‍රචාරණ දැන්වීම් අධ්‍යයනය කර නව ව්‍යාපාරයක් සඳහා සුදුසු ව්‍යාපාර අදහස් 5ක් ජනනය කරවන්න.
- කණ්ඩායම සාකච්ඡා කොට නව ව්‍යාපාරයක් සඳහා සුදුසු එක් ව්‍යාපාර අදහසක් තෝරා පන්තියට ඉදිරිපත් කරවන්න.
- තෝරාගත් ව්‍යාපාර අදහස එසේ තේරීමට හේතු ලබා ගන්න.

### III. කණ්ඩායම

- පුද්ගලික කුසලතා හා අත්දැකීම්/ පලපුරුදු 5 ක් ලිවීමට සලස්වන්න.
- එම කුසලතා හා පලපුරුදු අනුව නව ව්‍යාපාරයක් සඳහා සුදුසු වන ව්‍යාපාර අදහස් 5 ක් ජනනය කරවන්න.
- කණ්ඩායම සාකච්ඡා කොට, සුදුසු ව්‍යාපාර අදහසක් තෝරා සමස්ත පන්තියට ඉදිරිපත් කරවන්න.
- තෝරාගත් එම අදහස එසේ තේරීමට හේතු ලබා ගන්න.
-

සිසුන්ගේ ඉදිරිපත් කිරීම්වලින් අනතුරුව දී ඇති විෂය කරුණු පිළිබඳ ව අවබෝධය ලබා දෙන්න. මෙම නිපුණතා මට්ටමට අදාළ පාඩම්වලින් අනතුරුව පහත සඳහන් පැවරුම් සිසුන්ට ලබාදීමට යෝජනා කෙරේ.

- සෑම සිසුවකු ලවා ම ව්‍යාපාර අදහස් 5 ක් බැගින් ලිවීම.
- එම එක් එක් ව්‍යාපාර අදහසෙහි සුවිශේෂීත්වය ප්‍රකාශ කිරීම
- අවම ලෙස සිසුන් තුන්දෙනෙකු බැගින්වත් කණ්ඩායම් සාදා ඒ සිසුන් තිදෙනා අතර, ඔවුනොවුන්ගේ ව්‍යාපාර අදහස් හුවමාරු කර ගෙන අධ්‍යයනය කිරීමට සලස්වා, එකී තොරතුරු සමස්ත පන්තියට ලබාදීමට සැලැස්වීම.

**මූලික වදන් /සංකල්ප**

- ව්‍යාපාර අදහස්
- ව්‍යාපාර අදහස් මූලාශ්‍ර

**ගුණාත්මක යෙදවුම්**

- 10 ශ්‍රේණිය පොළපොත - 7 පරිච්ඡේදය
- ප්‍රචාරණ දැන්වීම් ඇතුළත් පත්තර පිටුවක්

**තක්සේරුකරණ හා ඇගයම් නිර්ණායක :**

- ව්‍යාපාර අදහස් සඳහා යෝග්‍ය නිදසුන් 5ක් දක්වයි.
- හොඳ ව්‍යාපාර අදහසක අවශ්‍යතාව හා වැදගත්කම සවිස්තර ව පැහැදිලි කරයි.
- ව්‍යාපාර අදහස් ජනනය කර ගත හැකි මූලාශ්‍ර සඳහා නිදසුන් ඉදිරිපත් කරයි.

**නිපුණතාව 4 :** යෝග්‍ය ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ පූර්ව සූදානම ප්‍රදර්ශනය කරයි.
**නිපුණතා මට්ටම 4.4:** ව්‍යාපාර අවස්ථාවක යෝග්‍යතාව තක්සේරු කරයි.
**කාලච්ඡේද ගණන :** 10
**ඉගෙනුම් ඵල :**

මෙම නිපුණතා මට්ටමට අදාළ පාඩම් අවසන් වීමෙන් පසු සිසුන්ට පහත සඳහන් ඉගෙනුම් ඵල අත්කර ගත හැකි ය.

- ව්‍යාපාර අදහස් හා ව්‍යාපාර අවස්ථාව අතර වෙනස පැහැදිලි කිරීමට.
- හොඳ ව්‍යාපාර අවස්ථාවක් තක්සේරු කිරීම සඳහා භාවිත කළ හැකි නිර්ණායක දැක්වීමට.
- නව නිෂ්පාදිතයකට නීත්‍යානුකූල රැකවරණය සලසා ගැනීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග පෙන්වා දීමට.

**පාඩම් සැලසුම සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව විෂය නිර්දේශයේ ඇති විෂය අන්තර්ගතය ද ඒ හා සම්බන්ධව පෙළපොතෙහි අඩංගු විෂය කරුණු පිළිබඳ ව ද මනා වැටහීමක් ලබා ගන්න. අනතුරුව පහත සඳහන් උපදෙස් කෙරෙහි අවධානය යොමු කරන්න.

- මෙම නිපුණතා මට්ටමට අනුව පළමු පාඩමට ප්‍රවේශවීමේ දී බෝනික්කෙකු හෝ (ඇඳුම් පැළඳුම් නැති) බෝනින්කෙකුගේ පින්තූරයක් පන්තියට ඉදිරිපත් කර එම බෝනික්කා වෙනුවෙන් ව්‍යවසායකයකුට කළ හැකි දේවල් විමසමින් බුද්ධි කලම්බන අභ්‍යාසයක නිරත කරවන්න. සිසුන් ඉදිරිපත් කරන සියලු ම අදහස් ව්‍යාපාර අදහස් ලෙස සැලකිය හැකි බව තහවුරු කරන්න. සෑම ව්‍යාපාර අදහසක් ම ව්‍යාපාරයක් ආරම්භ කිරීම සඳහා යෝග්‍ය නොවන හෙයින් වාණිජමය වශයෙන් සාර්ථක කරගත හැකි ව්‍යාපාර අදහසක් තෝරා ගත යුතු බවත් ඒ සඳහා ව්‍යාපාර අදහස් ඇගයීමකට ලක් කළ යුතු බවත් අවබෝධ කර දී පහත සඳහන් උපදෙස් අනුව සිසුන් කණ්ඩායම් වශයෙන් ක්‍රියාකාරකමෙහි නිරත කළ හැකි ය. කණ්ඩායම් කිරීමට සිසුන් ප්‍රමාණවත් නොවේ නම් එක් එක් සිසුවා කාර්යයෙහි නිරත කරවිය හැකි ය.

**1 වන අදියර - සාර්ව විශ්ලේෂණය**

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.
- කණ්ඩායම විසින් ආරම්භ කිරීම සඳහා සුදුසු ව්‍යාපාර අදහස් හැකි තරම් ජනනය කොට ඒවා ලියා ගැනීමට සලස්වන්න.
- තමන්ගේ **සාමාන්‍ය අවබෝධය** අනුව ව්‍යාපාරයක් කිරීමට සුදුසු යැයි අනුමාන කළ හැකි අදහස් 10 ක් තෝරා ගැනීමට උපදෙස් දෙන්න.

**11 වන අදියර - සූක්ෂ්ම විශ්ලේෂණය**

- 1 වන අදියරේ සිසු කණ්ඩායම ම තෝරා ගන්න. පෙර අදියරේ ව්‍යාපාර අදහස් අතුරෙන් වඩාත් යෝග්‍ය යැයි නිගමනය කරන ලද ව්‍යාපාර අදහස් පමණක් තෝරා ගැනීමට උපදෙස් දෙන්න.
- පහත සඳහන් ආකෘතියේ දැක්වෙන නිර්ණායකවලට අනුව 0-10 දක්වා පරාසයක ලකුණු ලබාදීමට උපදෙස් දෙන්න. එම නිර්ණායකවල සත්‍යතාව වැඩි නම් ඉහළ ලකුණක් ද සත්‍යතාව අඩු නම් පහළ ලකුණක් ද පිරිනමන්න.

| ඇගයීම සඳහා භාවිත කරන නිර්ණායක / ව්‍යාපාර අදහස | වෙළෙඳපොළ/ ඉල්ලුම (අලෙවි කර ගැනීමේ හැකියාව) | අවශ්‍ය කෙරෙන ශ්‍රමය සපයා ගැනීමේ හැකියාව | අවශ්‍ය කෙරෙන අමුද්‍රව්‍ය සපයා ගැනීමේ හැකියාව | අවශ්‍ය කෙරෙන තාක්ෂණ හා උපකරණ සපයා ගැනීමේ හැකියාව | තරගයට මුහුණදීමේ හැකියාව | ප්‍රාග්ධනය සපයා ගැනීමේ හැකියාව | රජයේ දිරිගැන්වීම තිබීම | ස්වකීය දැනුම, කුසලතා, පළපුරුද්ද, ඇල්ම ආදිය | මුළු ලකුණු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1. _ _ _ _ _ _ _ _ _ | | | | | | | | | |
| 2. _ _ _ _ _ _ _ _ _ | | | | | | | | | |
| _ _ _ _ _ _ _ _ _ | | | | | | | | | |

**III** වන අදියර **(SWOT)** විශ්ලේෂණය

- ශක්තීන්, දුර්වලතා, අවස්ථා හා තර්ජන පිළිබඳ ව නිදසුන් සහිත ව පැහැදිලි කර දී ඒ පිළිබඳ ව මනා අවබෝධයක් ලබා දෙන්න.
- ඉහත අදියරේ සිසු කණ්ඩායම ම යොදා ගන්න.
- II වන අදියරේ ඇගයීමෙන් වැඩි ම ලකුණු ලබාගත් ව්‍යාපාර අදහස් තුනක් පමණක් තෝරා ගැනීමට උපදෙස් දෙන්න.
- පෙර පරිදි ම 0-10 දක්වා පරාසයක ලකුණු පහත දැක්වෙන ආකෘතියේ දැක්වෙන නිර්ණායකවලට අනුව ලබාදීමට උපදෙස් දෙන්න.

| **ව්‍යාපාර අදහස** | **S ශක්තීන්** | **W දුර්වලතා** | **O අවස්ථා** | **T තර්ජන** | **මුළු ලකුණු** |
|---|---|---|---|---|---|
| 1. | | | | | |
| 2. | | | | | |
| 3. | | | | | |

- මෙහිදී වැඩිම ලකුණු හිමිකර ගෙන ඇති අදහස ව්‍යාපාරය සඳහා තෝරා ගැනේ.

- නිපුණතා මට්ටමට අදාළ පාඩම් නිමවීමෙන් අනතුරුව පහත සඳහන් ක්‍රියාකාරකමෙහි සිසුන් නිරත කිරීමට යෝජනා කෙරේ.

- ව්‍යාපාර අදහස් අතුරින් ව්‍යාපාර අවස්ථාවක් කරගත හැකි යෝග්‍ය අදහසක් තේරීම දක්වා වූ පියවර අනුගමනය කරමින් ව්‍යාපාර අවස්ථාවක් තීරණය කිරීම සඳහා වූ කේවල පැවරුමක් යෝජනා කෙරේ. එහිදී පහත උපදෙස් සිසුන්ට ලබා දෙන්න. මේ සඳහා ප්‍රමාණවත් කාලයක් ලබා දෙන්න.

  I පියවර

  ව්‍යාපාර අදහස් හැකි තරම් ජනනය කර ස්වකීය අවබෝධ හා වැටහීම අනුව සැලකිල්ලට ගෙන ඒවායින් සුදුසු ව්‍යාපාර අදහස් 10 ක් තේරීම

  II පියවර

  එම ව්‍යාපාර අදහස් 10 සූක්ෂ්ම විශ්ලේෂණය සඳහා භාවිත කරන ලද සාධක සැලකිල්ලට ගෙන ලකුණු 0-10 දක්වා පරාසයක ලකුණු ලබා දෙමින් වැඩිම ලකුණු ලබාගත් අදහස් 03 ක් තේරීම.

  III පියවර

  එම ව්‍යාපාර අදහස් 03 SWOT විශ්ලේෂණයකට භාජනය කර ව්‍යාපාර අවස්ථාවක් කර ගත හැකි සුදුසු ම ව්‍යාපාර අදහස තේරීම

**මූලික වදන් / සංකල්ප**

- ව්‍යාපාර අවස්ථා
- පේටන්ට් බලපත්‍රය
- සාර්ව විශ්ලේෂණය
- සූක්ෂම විශ්ලේෂණය
- ශ දු අ ත ( SWOT ) විශ්ලේෂණය

**ගුණාත්මක යෙදවුම්**

- 10 ශ්‍රේණියට පෙළපොත - 7 පරිච්ඡේදය
- බුද්ධි කලම්භනය සඳහා අවශ්‍ය ද්‍රව්‍ය
- ආකෘතිවල පිටපත්

**තක්සේරුකරණ හා ඇගයීම් නිර්ණායක :**

- සෑම ව්‍යාපාර අදහසක් ම හොඳ ව්‍යාපාර අවස්ථාවක් නොවන බව නිගමනය කරයි.
- විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කරමින් ව්‍යාපාර අවස්ථාවක් කර ගත හැකි ව්‍යාපාර අදහසක් තෝරයි.
- ව්‍යාපාර අවස්ථාවක් කර ගත් ව්‍යාපාර අදහසට නීත්‍යානුකූල රැකවරණ සලසා ගත හැකි ආකාරය පැහැදිලි කරයි.